DOI: https://doi.org/10.4038/p.v14i1.27

*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. I, Jun. 2023, 54-73.*

# පෙරහැර මංගල්‍යය සහ සමාජ අනුකලනය: (අනුරාධපුර අභයගිරි පෙරහැර ආශ්‍රයෙන් සිද්ධි අධ්‍යයනයක්)

# [The Perahera Festival and Social Integration: (A Case Study Based on Anuradhapura Abhayagiri Perahera)]

**Upali Weerakoon**[1]

## Abstract

The Perahera festival, which has a significant effect on a group of people and leads to societal integration, illustrates key features of Buddhist history. Accordingly, the specific objectives of this study were to explore how Perahara affects individuals in North Central Province, to discover deity cults associated with Perahera, and to analyze the influence of Perahera on society. This qualitative study gathered data using semi-structured interviews and direct and indirect observations. Purposive sampling was utilized to obtain primary data, and the study sample included 10 villages and two government personal from the research area. The study found that government and provincial assistance is critical in developing consciousness about Perahera. Since they all became spectators of Perahera. This Perahera played a crucial role in transferring Buddhist ideals to people and influencing build up the collectivity of people by disregarding distinction based on lay clergy, gender, race, religion, age, and caste. Perahera has led to people becoming organizers and gatherings, discussions, and decision-making of the organizing committees have produced collective consensus. Furthermore, giving arms and providing food for animals increased charity and interrelationships with people and other temples.

**Keywords:** Abhayagiri Perahera, Cultural Ceremony, Refectories, Buddhist Shrines, Social Integration

1 Senoir Lecturer, Department of Sociology, University of Peradeniya, Sri Lanka.
E-mail: weerakoonupali@yahoo.com https://orcid.org/0000-0001-6676-0895

Received: 15 February 2023, Accepted revised version: 20 June 2023.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

බෞද්ධ පෙරහැර මංගල්‍යය ශ්‍රී ලාංකික සමාජයේ සංස්කෘතිය[1] තුළ දැකිය හැකි සුවිශේෂී අංගයකි. එක් අතකින් සමාජය[2] ප්‍රබෝධමත් කිරීමට හා බෞද්ධ ජන සමාජයේ පුනර්ජීවනය සඳහා පෙරහැර පැවැත්වීම වැදගත් වේ. අනික් අතට අනෙකුත් ජන සමූහ වෙත ආකර්ශනීය බලපෑම් ඇති කිරීමට හා ජන සහයෝගිත්වය සඳහා මෙම පෙරහැර පැවැත්වීම වැදගත් වේ. සමාජගත වන නව පරම්පරාවට බෞද්ධ ප්‍රෞඪ ඉතිහාස හා උරුමය පිළිබඳ දැනුම මෙමඟින් සම්ප්‍රේෂණය කරනු ලබයි. එසේම සෙසු ජන සමූහවලට බෞද්ධ ජන සමාජයේ තිබෙන සංස්කෘතික අංග ලක්ෂණ හා ක්‍රියාවලීන් දැන හඳුනාගැනීමට ඉඩකඩ විවර කරනු ලබයි. ඒ අනුව බෞද්ධ සංස්කෘතිය තුළ තිබෙන සංස්කෘතික අංග ප්‍රකට හා අප්‍රකට දෙආකාරයට සමාජය වෙත මුදා හැරීම සඳහා පෙරහැර මංගල්‍යය පැවැත්වීම වැදගත් වේ.

සංකීර්ණ ගති ස්වභාවයක් ගන්නා සමාජයක විවිධ ජන සමූහ ජීවත් වේ. මෙහිදී ඔවුනොවුන්ට ආවේණික වූ විවිධ සංස්කෘතික උත්සව රටා පවතී. පෙරහැර පැවැත්වීම එක්තරා ආකාරයක සංස්කෘතික මංගල්‍යයකි. විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික වූ නොයෙකුත් සංස්කෘතික උත්සව පවතී. ශ්‍රී ලාංකික බෞද්ධ ජන සමාජයේ ඇති ප්‍රධානතම සංස්කෘතික උත්සවයක් ලෙස බෞද්ධ පෙරහැර පැවැත්වීමේ අවස්ථාව හඳුනා ගත හැකිය. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ[3] මෙරටට වැඩමවීම හා ඊට පුදසත්කාර කරනු සඳහා ඇසළ පොහොය දිනය මූලික කොට මුලදී පවත්වන ඇසළ පෙරහැර ප්‍රධාන එකකි. එසේම මිහිඳු හිමියන් විසින් මෙරටට බුදුදහම රැගෙන ඒම[4] සිහිකිරීම පිණිස පොසොන් පොහොය දිනය මුල්කොට පැවැත්වෙන මිහිඳු පෙරහැර තවත් එකකි. එසේම ප්‍රාදේශීය වශයෙන් මෙරට වෙහෙර විහාරස්ථාන රැසක පෙරහැර මංගල්‍යය පවත්වනු ලබයි. කොළඹ ගංගාරාම විහාරය කේන්ද්‍ර කොට පැවැත්වෙන නවම් මහා පෙරහැර,[5] මහියංගන විහාරය, බෙල්ලන්විල විහාරය ඇතුලු විහාර ගණනාවක් විසින් වාර්ෂික පෙරහැර උත්සව පවත්වනු ලබයි. ඊට අමතරව දේවාල මුල්කොට පෙරහැර පැවැත්වීම ද සිදුවේ. ඒ අතර කතරගම, මාවනැල්ල-අලුත්නුවර, මාතර-දෙවිනුවර ආදී ප්‍රදේශවල තිබෙන දේවාල මුල්කරගෙන වාර්ෂික පෙරහැර පැවැත්වීම දැකිය හැකිය. මෙරට පැවැත්වෙන බෞද්ධ පෙරහැර චාරිත්‍රය පිළිබඳ බොහෝ සමාජ හා මානව ශාස්ත්‍ර විෂයන්වල දී අවධානයට හා සාකච්ඡාවට යොමු වී තිබේ. ඒ අනුව අනුරාධපුර අභයගිරි විහාරය මුල්කොට වාර්ෂිකව පැවැත්වෙන ඇසළ පෙරහැර මංගල්‍යය තුළින් පිළිබිඹු වන සමාජ අනුකලනය (social integration) විග්‍රහ කිරීම මෙම පර්යේෂණාත්මක ලිපියේ සාදෘශ්‍යය බවට පත්වේ.

## අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම අධ්‍යයනයට අදාළ පර්යේෂණ ක්ෂේත්‍රය වන්නේ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පූජා නගරය[14] තුළ තිබෙන පුරාණ අභයගිරි විහාරස්ථානයයි. අනුරාධපුරයේ පැවති විහාරාරාම අතුරින් විශාලතම ආරාම සංකීර්ණය වන්නේ අභයගිරියයි. කලාත්මක වාස්තුවිද්‍යාත්මක ආදී විවිධ මානයන්ගෙන් බලන විට අනුරාධපුරයේ ආකර්ශනීය ස්මාරකයන් බොහොමයක් අයත් වන්නේ අභයගිරි සංකීර්ණයටයි. අභයගිරි විහාර සංකීර්ණය අක්කර 500ක පමණ භූමි භාගයක පැතිර පවතී. වළගම්බා රජ විසින් මෙම විහාරය තනවා කුපික්කල මහා තිස්ස ස්වාමීන් වහන්සේට පූජා කරනුයේ කෘත ගුණ දැක්වීම සඳහාය. මෙම විහාරය පෞද්ගලිකව පිළිගැනීම නිසා මහා විහාර භික්ෂූන් වහන්සේලා මෙම තිස්ස හිමිට කුල දූෂක ලෙස නම් කොට මහා විහාරයෙන් නෙරපා ඇත. එහිදී තිස්ස ස්වාමින් වහන්සේගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් විශාල අනුගාමිකයන් රැසක් සමග

මහා විහාරයෙන් ඉවත්ව අභයගිරියට ගොස් ඇත. මෙය ශ්‍රී ලංකාවේ ඇතිවුණු පළමු සංඝ භේදය ලෙස සැලකේ. ථෙරවාදයට නොගැළපෙන බව සැලකෙන දහමක් දේශනා කරන ඉන්දියාවේ සිට පැමිණි ධම්මරුචි නම් භික්ෂුව ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා පිරිසක් අභයගිරියට පැමිණ ඇත. ඔවුන්ගේ දහම අභයගිරිවාසී භික්ෂූන් පිළිගැනීම නිසා ඔවුන් ධම්මරුචි නිකාය වශයෙන් ප්‍රකට විය. අභයගිරි විහාරය ලංකාවේ මහායාන බුදුදහමේ කේන්ද්‍රස්ථානය විය. සිව්වන ශතවර්ෂයේ දී පමණ මහසෙන් රජු විසින් මහා විහාරය විනාශ කොට අභයගිරිය නගා සිටුවන ලදි. ඒ අනුව පස්වන සියවස පමණ වන විට අභයගිරි පාර්ශවයේ භික්ෂූන් වහන්සේලා පන්දහසක් පමණ සිටි බව කියැවේ. දන්ත ධාතුන් වහන්සේ හා පාත්‍රා ධාතුව ද මෙම විහාර සන්තකයේ තිබුණු බැවින් අභයගිරිය ඉතා ප්‍රබල ස්ථානයක තිබුණු බව පෙනේ.[15]

## අධ්‍යයන ක්‍රමවේදය

සමාජයක් තුළ සාමාජිකයන් හුදකලාව ජීවත් නොවන අතර ඔවුන් සමූහ වශයෙන් ජීවත් වෙමින් ජීවන චර්යාව පවත්වාගෙන යයි. සමූහයක් ලෙස ජීවත්වන විට සමූහය හා පුද්ගලයා අතර ඇතිවන සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් ලෙස විවිධ හැසිරීම් රටා ඇතිවේ. සමාජ විද්‍යාත්මක හෝ සමාජ මානව විද්‍යාත්මක පර්යේෂණවලින් සිදු කරනුයේ මානව චර්යාව සඳහා බලපා ඇති හෝ බලපාන සාධක අධ්‍යයනය කිරීමයි.

මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ (Qualitative Research) විධික්‍රමය යොදා ගැනිණි. මේ යටතේ සම්මුඛ සාකච්ඡා (Interviews) විධි ක්‍රමය ප්‍රධාන ලෙස දත්ත රැස් කිරීමට භාවිත කෙරිණි. ඊට අමතරව ඍජු හා වක්‍ර නිරීක්ෂණ (Direct and Indirect Observations), සහ මූලික තොරතුරු සපයන්නන් (Key Informants) ඇසුරින් අධ්‍යයනයේ දත්ත එක්රැස් කිරීම සඳහා භාවිත කෙරිණි.

## දත්ත රැස් කිරීම

පර්යේෂණයට අදාළ ප්‍රාථමික දත්ත රැස් කිරීම අධ්‍යයන ප්‍රදේශයේ ජීවත්වන තෝරාගත් ගම්වැසියන් ඇසුරින් සිදු කෙරිණි. දස දෙනෙකුගෙන් නියැදිය සමන්විත විය. නියැදිය තේරීම අරමුණු සහගත ක්‍රමවේදය යටතේ සිදු කෙරිණි. තෝරාගත් නියැදි සාමාජිකයන් සමග සම්මුඛ සාකච්ඡා ඇසුරින් අධ්‍යයන තොරතුරු එක්රැස් කර ගැණුනි. ඊට අමතර ව අධ්‍යයන මාතෘකාව ගැන අවබෝධයක් තිබෙන රජයේ නිලධාරීන් දෙදෙනෙකු මූලික තොරතුරු ලබා ගැනීම සඳහා සහභාගි කර ගැණුනි. ඊට අමතරව නිරීක්ෂණය අධ්‍යයන තොරතුරු රැස් කිරීමට යොදාගත් ක්‍රමවේදයක් විය. අභයගිරි විහාර භූමියට අයිති පෞරාණික නටඹුන් ස්ථාන නිරීක්ෂණය හා ඒ ඇසුරින් ලබාගත් අවබෝධය අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරු තහවුරු කර ගැනීමට උපකාරී විය.

## අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ

- අභයගිරි පුරාණ විහාරස්ථානය කේන්ද්‍රකොට පැවැත්වෙන පෙරහැර මංගල්‍යය තුළින් විද්‍යමාන කෙරෙන සමාජ අනුකලනය හඳුනා ගැනීම ය.

## අධ්‍යයනයේ උප අරමුණු

- අභයගිරි පෙරහැර උතුරු මැද පළාත් වැසියන්ට විශේෂ වන අයුරු පරීක්ෂා කිරීම
- අභයගිරි පෙරහැර හා දේව වන්දනය හඳුනා ගැනීම
- අභයගිරි පෙරහැර මහා සමාජයට කෙසේ සම්බන්ධ වන්නේදැ යි සොයා බැලීම

## අධ්‍යයන විශ්ලේෂණය

### අභයගිරි ඇසළ පෙරහැර මංගල්‍යය සහ ආගමික ප්‍රබෝධය

ශ්‍රී ලංකාවේ පැවැත්වෙන බෞද්ධාගමික

පෙරහැර අතර අභයගිරි විහාරයේ වාර්ෂිකව පැවැත්වෙන ඇසළ පෙරහැර මංගල්‍යය ද ප්‍රධාන එකකි. වසරේ සෑම ජූලි මසකම මෙම පෙරහැර චාරිත්‍රානුකූලව පැවැත්වේ. බුදුරජාණන් වහන්සේට සිදුකරන වන්දනා මාන පිළිවෙත් අතරට මෙම පෙරහැර චාරිත්‍රය ද එක්වීම මිනිසුන් විශේෂ ආගමික හැසිරීම් රටාවකට හුරුපුරුදු කිරීමට බලපෑ තවත් එකකි. බුදුන් වහන්සේගේ ශ්‍රී වාම දන්ත ධාතුව[16] මුල්කොට පෙරහැර මංගල්‍යය සිදු කෙරේ. බෞද්ධ ජන සමාජයේ ආගමික පිබිදීම තීව්‍ර කිරීමට මෙම ආගමික උත්සවයේ බලපෑම වැදගත් එකකි. ලෝවැසි දනන් සසරින් එතෙර කරවීම පිණිස මග පෙන්වූ සිය ශාස්තෘවරයාණන් සේම උන්වහන්සේ දේශනා කරන ලද ධර්මය සහ එහි අනුගාමිකයන් සිහිපත් කිරීමට අවැසි ආගමික පසුබිම පෙරහැර මංගල්‍යය තුළින් විවර කෙරේ. පුද්ගලයාගේ ආගමික හැඟීම් වසරක් පාසා ප්‍රකෘතිමත් කිරීමට මෙම පෙරහැර ප්‍රබල සාධකයක් වී තිබේ. මෙම අභයගිරි පෙරහැර පෙර රජ දවස පටන් පැවැත එන බව පැහැදිලි විය. අධ්‍යයන තොරතුරුවලින් හෙළිවූයේ මෙම පෙරහැර සඳහා රාජ නියෝග ලබා දුන් බවයි.

කිත්සිරිමෙවන් රජ්ජුරුවන්ගේ කාලයේ ඉඳන් මේ පෙරහැර පවත්වන්නෙ... ඇතුල්නුවර තමා දළදා මාළිගාව තිබුනේ...' හැම වර්ෂයකම දළදාව අභයගිරියට වඩම්මවා පෙරහැර පවත්වන ලෙසට රජු නියෝග කළා.... (සාකච්ඡාව-1).

රාජ්‍යත්වය උසුලන පාලක පිරිස විසින් ශ්‍රී දළදා වහන්සේ වෙත දක්වන ගෞරවය හා එක් අතෙකින් ශ්‍රී ලංකා සමාජය තුළ බෞද්ධ සමාජයක් ලෙස පිළිගැනීමට හේතුවේ. පෙර රජ දවස පටන් පැවත එන මෙම පිළිගැනීම වත්මන් සමාජ සංදර්භය තුළින් ද දැකගත හැකිය. රාජ්‍ය පාලකයා දැහැමි කෙනෙකු වීමේ අවශ්‍යතාව බුදුදහම විසින් තහවුරු කරන කරුණකි. අග්ගඤ්ඤ සූත්‍රය, චක්කවත්ති සීහනාද සූත්‍රය මෙන්ම සූත්‍ර පිටකයේ දීඝනිකායේ දී රාජ්‍ය පාලනයට අදාළ වන කරුණු බුදුන් වහන්සේ විසින් දේශනා කර ඇත. චක්කවත්තිසීහනාද සූත්‍රයේ රටක වැසියන් දිළිඳු වීමට මුල්වන කරුණු සාකච්ඡා කර තිබේ. රටේ පාලකයා දසරාජ ධර්මයෙන් රට පාලනය කිරීමේ වැදගත්කම බුදුදහම අවධාරණය කරයි. පාලකයා මධ්‍යස්ථව පක්ෂග්‍රාහී නොවී ක්‍රියා කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. එහෙත් වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දී සිටින සමාජ, ආර්ථික හා දේශපාලන ව්‍යසනයන් දෙස බලන විට රටෙහි පාලක පිරිස කොතරම් දුරට බෞද්ධ දර්ශනයට අදාළව කටයුතු කරන්නේ ද යන්න ගැටලු සහගත ය.

බෞද්ධාගමික පුද පිළිවෙත් සමාජය නිවැරදි දිශාවට හැරවීමට හේතුවේ. මේ සඳහා බුදුන් වහන්සේගේ අනුගාමිකයින් වූ මහා සංඝ රත්නයේ මූලිකත්වයෙන් සිදුකරන බෞද්ධාග මික වැඩ සටහන් වැදගත් වේ. මෙරට වසර තිහකට ආසන්න කාලයක් දමිළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා අතර පැවති යුද ගැටුම් කාලයේ පවා අභයගිරි විහාරයේ වාර්ෂික පෙරහැර මංගල්‍යය අඛණ්ඩව පැවැත්වීමට මහා සංඝයා වහන්සේලා පෙරමුණ ගෙන ක්‍රියා කිරීම හඳුනා ගත හැකිවිය.

පසුගිය කොවිඩ් (Covid) වසංගතය සහ වර්තමානයේ (මෙම පර්යේෂණය සිදුකළ සහ ලිපිය ලියන කාලය 2022 ජුනි, ජූලි, අගෝස්තු මාස) රටේ පවතින ආර්ථික අස්ථාවර බව නිසා වසර දෙකක කාලයක් පෙරහැර පැවැත්වීමට නොහැකි වී තිබේ. මේ සඳහා රජයේ මැදිහත්වීමක් සිදුවූයේ නම් මෙම පෙරහැර සංකේතවත් පරිදි හෝ සිදුකොට දළදා වහන්සේ උදෙසා චාරිත්‍ර ඉටු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

අපි කෘතගුණ ඇති ජාතියක් විදියට කෙනෙක් කරපු හොඳ දෙයක් නොකියා ඉන්ට හොඳ නෑ... ඇත්තටම මේ පෙරහැර පවත්වපු ස්වර්ණමය යුගය තමයි මහ ඇමති බර්ටි

ප්‍රේමලාල් මහතාගේ කාලය කියල කියන්ට ඕනෑ... මේ පෙරහැර රජරට ප්‍රදේශයේ ප්‍රධාන මංගල්‍යය බවට පත්කළේ එතුමා... මහ ඇමති ලෙස එතුමා මේ පෙරහැරට රාජ්‍ය අනුග්‍රහය අරන් දුන්නා... පළාත් සභාවෙන් මුදලක් වෙන් කළා... එල් ටී ටී ඊ යුධ කාලෙත් පෙරහැර පැවැත් වුවා... පෙරහැර බලන්ට මිනිස්සුත් ආවා අලි 15ක් විතර පෙරහැරට සම්බන්ධ කර ගන්ට පුලුවන් වුනා...'' (සාකච්ඡාව-1).

පළමු සාකච්ඡාවෙන් පැහැදිලි වන අන්දමට සමස්ත රට වැසියාගේ අවධානයට යොමුවන සංස්කෘතික මංගල්‍යයක් සඳහා රජයේ දායකත්වය ඉතා වැදගත් වේ. මෙම දළදා පෙරහැර සඳහා අතීතයේ සිට එම රාජ්‍ය දායකත්වය ලැබුණු අන්දම විවිධ මූලාශ්‍රයවලින්[17] කරුණු අනාවරණය කර තිබේ. එහි සෑම අවස්ථාවකම දළදා පෙරහැර වෙනුවෙන් රජුගේ මැදිහත්වීම ගැන කරුණු සඳහන් වේ. අභයගිරි ඇසළ පෙරහැර උතුරු මැද පළාතේ ප්‍රධානතම සංස්කෘතික උළෙල බවට පත් කිරීමට එවකට රජයේ මහ අමාත්‍යතුමාගේ අනුග්‍රහය වැදගත් සාධකයක් වී ඇත. පළාත භාර මහ ඇමතිවරයාගේ සෘජු මැදිහත්වීම හරහා පළාතේ සෙසු නායක කාරකාදීන්ගේ අවධානය මේ වෙත නිතැතින්ම යොමුවීමට හේතුවක් වන්නට ඇත. මේ පසුබිම පෙරහැරේ සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වූ කරුණක් බව පැහැදිලි වන්නකි.

සමාජයක ආගමික පුනර්ජීවනය සඳහා රජයේ සහාය ඉතා වැදගත් කාරණයක් බව පැහැදිලි දෙයකි. මෙයට කලින් පෙන්වා දුන් පරිදි අනුරාධපුර නගරය පූජා නගරයක් බවට පත් කිරීම සඳහා ආණ්ඩුවට සම්බන්ධ රජයේ ඉහළ නිළධාරීන්ගේ මැදිහත් වීම හා නිර්දේශයේ වලංගුතාව ගැන කරුණු හෙළි වූවකි. මෙරට පැවති ඊළාම් ත්‍රස්තවාදය සලකන විට අනුරාධපුරය ඊට ගොදුරු වන මූලික තැනකි. මෙරට යුධ ගැටුම් අවස්ථා බොහොමයකදී අනුරාධපුර නගරය හා තදාසන්න ප්‍රදේශ ඉලක්ක විය. 1983 වසරෙන් පසුව ආරම්භ වූ සිවිල් යුද්ධයේදී දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය මගින් මේ ප්‍රදේශයට විටින් විට ප්‍රහාර එල්ල කළේය. ශ්‍රී මහා බෝධිය හා ගුවන් තොටුපොළට එල්ල කළ ත්‍රස්ත ප්‍රහාර එයින් ප්‍රධානය. එසේම සිංහල වැසියන් බහුලව ජීවත් වන ගම්වලට පහර දෙමින් මිනිස් ඝාතන සිදු කළහ. 1985 වසරේ මැයි මස 14 වැනි දින අනුරාධපුර නගරයට එල්ල කළ ප්‍රහාරයෙන් සාමාන්‍ය වැසියෝ 125 දෙනෙකු මිය ගියහ (National Peace Council, 2003).

ඉතා දරුණු යුධ පසුබිමක වුවද අනුරාධපුර නගරයේ අභයගිරිය මහා විහාරයේ ඇසළ පෙරහැර වීථි සංචාරය කිරීමට තරම් පසුබිමක් පැවති බව පැහැදිලි වෙයි. විශේෂයෙන්ම ආරක්ෂක වැඩ පිළිවෙල සාර්ථකත්වය සඳහා ආණ්ඩුවේ මැදිහත්වීම ඉතා වැදගත් විය. පෙරහැර ක්‍රියාවලියට රජය මුල්වීම මගින් රාජ්‍ය යාන්ත්‍රණය බෞද්ධත්වයට මූලිකත්වය දෙන අයුරු විද්‍යමාන කරවයි. පාලකයා බෞද්ධයෙකු විය යුතුය යන කාරණය ඔප්පු කර පෙන්වන අවස්ථාවක් ලෙස මෙම අවස්ථාව හඳුනා ගත හැකිය. මේ නිසා පාලකයා හා බෞද්ධ සමාජය අතර අන්තර් සම්බන්ධතාවක් ගොඩනැගීමට මෙය ද අවස්ථාවක් වී තිබේ. සමාජයේ සිදුවිය යුතු සමාජයීය හා ආගමික ඉදිරි ප්‍රතිශෝධන පිළිබඳ සාකච්ඡා ක්‍රියාමාර්ග වෙත පිවිසීමට මෙවැනි අවස්ථා වැදගත් වෙයි.

අභයගිරි ඇසළ පෙරහැර පළාතේ වෙසෙන ජනතාවගේ නොමද ගෞරවයට ලක්වූ සංස්කෘතික මංගල්‍යයක් බව පැහැදිලි විය. රටේ වෙනත් පළාත්වල පැවැත්වෙන පෙරහැර නැරඹීමට යාමට නොහැකි මිනිසුන්ට මෙම පෙරහැර නැරඹීමට පුළුවන. පවුලේ මව්පිය වැඩිහිටියන් හා දූදරුවන් සියලු දෙනා සමග පෙරහැර නැරඹීමට යාමට හැකි වන්නේ තමන් ජීවත් වන ප්‍රදේශයේ පෙරහැර පැවැත්වෙන නිසාය. එහෙත් දුර බැහැර පළාත්වල පැවැත්වෙන පෙරහැර

නැරඹීමට යාම අපහසු බවත්, ඊට අවශ්‍ය මුදල් නොමැති බවත් අනාවරණය වූවකි.

''මේ පෙරහැර අපිට නං ආඩම්බරයක්... ගෞරවයක්... නුවර පෙරහැර බලන්ට ගිහිල්ලා නෑ... එච්චර දුර යන්ට අමාරුයි... එච්චර වියදං කරන්ට සල්ලිත් නෑ... මේ පෙරහැරෙත් අලි යනවා ...අපේ දෙමව්පියෝ, ළමයි එහෙම එකතුවෙලා පෙරහැර බලන්ට යනවා... ගමේ ඉන්න අයත් එකතු වෙනවා... එච්චර දුරක් නෑ... අපි පයින් යන්නේ'' (සාකච්ඡාව-5).

උතුරු මැද පළාත ලංකාවේ වෙනත් පළාත්වලට වඩා විශාල භූමි ප්‍රදේශයක ව්‍යාප්තව පවතී. මෙහි ජීවත්වන මිනිසුන්ගෙන් වැඩි පිරිසක් ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තය තෝරාගෙන තිබේ. මෙම පසුබිම මෙහි වෙසෙන ජනයා අතර සමීප සම්බන්ධතා ගොඩනැගීමට බලපා තිබෙන්නකි. මෙම පළාත තුළ මව්පිය දූදරු පමණක් නොව අසල්වැසි සම්බන්ධතාවල පවතින සමීප බැඳීම තවමත් හඳුනා ගත හැකිය. පවුලේ අය පමණක් නොව අසල්වැසියන් ද පෙරහැර නැරඹීම සඳහා එක්වන බව පවසා ඇත. අනෙක් අතට පවුලේ සාමාජිකයන් අතර පමණක් නොව අසල්වැසියන් අතර ද සමීපත්වය ගොඩ නැගීමට පෙරහැර මංගල්‍යය අතරමැදියෙකු බවට පත්ව තිබේ.

පෙරහැර නැරඹීමට යාම සඳහා ප්‍රවාහන ක්‍රමවේද භාවිත කර නැත. බොහෝ අය පා ගමනින් පෙරහැර නැරඹීමට යන බැව් සම්මුඛ සාකච්ඡා පහෙන් සඳහන් වෙයි. අනුරාධපුර නගරය ආසන්නව පදිංචිව සිටින අය බොහෝ දෙනා පා ගමනින් පැමිණ පෙරහැර නරඹන බව පෙනේ. පෙරහැර නැරඹීම කෙරෙහි වැඩි උනන්දුවක් දක්වන බව මෙයින් පැහැදිලි වෙයි. අනික් අතට සම්මුඛ සාකච්ඡා තුනෙන් හෙළිවූ පරිදි දන්සැල්වල ආහාර පාන භුක්ති විඳීමේ අවස්ථාව මොවුන්ට උදාවෙයි. එය එක්තරා අන්දමක නැවුම් අත්දැකීම් ගෙන දෙන්නක් විය හැකිය. සැබැවින් මෙවැනි අවස්ථා පවුලේ අය අතර පමණක් නොව සමාජයේ සාමාජිකයන් අතර පවතින බැඳීම ද තව තවත් තහවුරු කරන බව පැහැදිලි ය. මේ තත්ත්වය පවුල නමැති ආයතනය තුළ පවතින අන්තර් බැඳියාව ශක්තිමත් කෙරේ. එසේම සමාජයේ සාමාජිකයන් අතර පවතින අමනාපකම් බැහැර කොට අලුතින් සමාජය සකස්වීමට හේතු වේ.

**පෙරහැර මංගල්‍යයේ ඉතිහාසය**

ශ්‍රී ලාංකික සමාජයේ සංස්කෘතික පුනර්ජීවනය ඇති කරනු වස් සිදු කෙරෙන ශ්‍රී දළදා පෙරහැර මංගල්‍යයෙහි පුනරාගමනය සියවස් ගණනාවකට දිවෙයි. මේ පිළිබඳව සිදුකළ ගවේෂණ මෙන්ම දේශාටන සටහන් වාර්තාවලින් තොරතුරු හෙළිවෙයි (ධම්මානන්ද හිමි 1916). ඒ අතුරෙන් ක්‍රිස්තු වර්ෂ පස්වැනි සියවසේ ලක්දිවට පැමිණි ෆාහියන් චීන භික්ෂුව[6] විසින් ඉදිරිපත් කර තිබෙන දේශාටන සටහන් වැදගත් තැනක් ගනියි. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ චීන වන්දනාකරුවෙකු වූ ෆාහියන් භික්ෂුවගේ ගමන් විස්තරයෙහි සඳහන් වන අන්දමට රජු විසින් සාදන ලද අනුරාධපුර දළදා මැදුරේ[7] සිට දළදා වහන්සේ පෙරහැරින් අභයගිරි විහාරය වෙත වැඩමවා තිබේ. පසුව පුරාදින අසූවක කාලයක් ඉමහත් ගෞරව පූර්වකව දළදා වහන්සේ ප්‍රදර්ශනය කර තිබේ. පසුව පොළොන්නරුවට වැඩම කරවූ[8] දළදා වහන්සේට පළමුවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි. ව. 1153-1186) විසින් මහත් හරසර දක්වා ඇත. නගරය හා මංමාවත් අලංකරණය කොට උත්කර්ෂවත් පෙරහැරක් පැවැත්වීම ගැන තොරතුරු චූලවංශයේ සඳහන් වේ. අනතුරුව ආරක්ෂිත ක්‍රමෝපායන් පිණිස දළදා වහන්සේ දඹදෙණියට වැඩම කරවා තිබේ. එහිදී දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ (ක්‍රි. ව. 1236-1270) පුද සත්කාර හා ගරු බුහුමන්වලට දළදා වහන්සේ පාත්‍ර විණි. දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින්

සිය මාළිගය අසළ තෙමහල් මන්දිරයක දළදාව තැන්පත් කළ බව ද, පියාණන් වූ විජයබාහු ඉදිකළ විජයසුන්දරාරාමයට ද දළදාව වැඩමවා මහත් පූජාවක් සිදුකළ බවට දඹදෙණිය කතිකාවේ සඳහන් වේ (වජිර හිමි 2008).

දළදා වහන්සේ වෙනුවෙන් පෙරහැර පැවැත් වූ අනුරාධපුර යුගයෙන් පසුව උත්කර්ෂවත් පෙරහැර පැවැත්වීම සිදුවනුයේ පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාලන සමයේය. මෙම පෙරහැරේ විශේෂත්වය වන්නේ ඇතැම් අය නාට්‍ය ගීතාදියෙන් පුද පූජා කරමින් ධජ පතාක රැගෙන යාමයි. නාටක ස්ත්‍රීන් වෙන් වෙන් කොට සිටුවා ඔවුන්ගේ නැටුමෙන්, ගීයෙන්, වැයුමෙන් ද පුදන්නේ නන් කුසුමෙන්, දුමින් නන් වැදෑරුම් ගඳින් සියලු නුවර සුවඳ කවමින් බොහෝ ජනයන් පිනවමින් නොයෙක් පහන් දසුන්ගේ අලුයෙන් හාත්පස සියලු දිගුන් හා එසේම විද්‍යාවන් එකලු කොට ඡත්‍රචාමර පන්තීන් දල විජිත්‍ර ඕවජ පන්තීන් ද යනාදියෙන් පෙරහැර විචිත්‍රවත් කර තිබේ (සුමංගල හිමි සහ දේවරක්ඛිත හිමි, 1996).

වර්තමානයේ බුදුන් වහන්සේගේ වාම දන්ත ධාතුව වැඩ සිටින මහනුවර දළදා වහන්සේ උදෙසා ඇසළ පෙරහැර වාර්ෂිකව උත්සවාකාරයෙන් පවත්වනු ලබයි. මේ පිළිබඳව මහාචාර්ය රැල්ප් පීරිස් මෙසේ සඳහන් කර තිබේ. “ඉංග්‍රීසි ආණ්ඩුව භාරයේ තිබූ දළදා වහන්සේගේ භාරකාරත්වය උඩරට ප්‍රභූන් වෙත යළි පැවරීම සඳහා 1828 දී ආණ්ඩුකාර තැන්පත් සර් එඩ්වඩ් බාන්ස් මහනුවර දී පෙරහැරක් පැවැත්වීමට කටයුතු සංවිධානය කළේය. පැරණි චාරිත්‍රානුකූලව විසිතුරු ලෙස සංවිධානය කරන ලද මේ උත්සවය අත්‍යලංකාර අන්දමින් පවත්වන ලදි (පීරිස් 1964: 133).

වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළ පැවැත්වෙන පෙරහැර මංගල්‍යය අතුරෙන් අනුරාධපුර නගරයේ පිහිටි පුරාණ අභයගිරි විහාරයක් කේන්ද්‍රකොට වාර්ෂිකව පැවැත්වෙන පෙරහැර පෙර රජ දවස පටන් පැවත එන්නකි. ඒ පිළිබඳ චීන ජාතික ෆාහියන් භික්ෂුව විසින් ඉදිරිපත් කර තිබෙන වාර්තාවේ තොරතුරු විස්තර වේ. “රජුගේ මාළිගාව පැත්තේ බුදුන්ගේ විහාරයයි. දත්, අඩි සිය ගණනක් උස, ස්වර්ණාභරණවලින් දීප්තිමත් හා දුර්ලභ මැණික්වලින් අලංකාර කර ඇත. විහාරයට ඉහළින් මහා පද්මරාජ (මාණික්‍ය) මාණික්‍යයක් සවිකර ඇති අතර සෘජු කණුවක් තබා ඇත. බුදුන් වහන්සේගේ දළදා වහන්සේ සෑම විට ම තුන්වන මාසයේ මැද භාගයේ දී වැඩම කරන ලදි. දින දහයකට පෙර රජතුමා විශාල ඇතෙකු පිට නැගී, රාජ වස්ත්‍ර හැඳ, පැහැදිලිව කථා කළ හැකි මිනිසෙකු ඇතු පිටට නැගී, ඒ මිනිසා විශාල බෙරයක් ගසමින්, බුදුරදුන්ගේ ජීවිතය හා ගුණ විස්තර කරමින් වටේට ගොස් ප්‍රකාශ කළේය. මෙයින් දින දහයකට පසුව බුදුන් වහන්සේගේ දළදා වහන්සේ වැඩම කරවා, අභයගිරි විහාරයට වඩිනවා, පින් රැස්කර ගැනීමට කැමැති පැවිද්දෝ වේවා, ගිහි පැවිද්දෝ වේවා, සියලු දෙනාම ඒ මාර්ගය සුමටව හා යහපත් තත්ත්වයෙන් සකස් කරවා, මංතීරු හා මාර්ග උත්කර්ෂවත් ලෙස සරසවා, ඒ සඳහා පුදනු පිණිස මල් දුම් තොග වශයෙන් ගබඩා කරත්වා...” මෙම ප්‍රකාශය අවසන් වූ පසු රජතුමා ජාතක කථාවලට අනුව බුදුරදුන් පෙර භවවල පහළ වූ විවිධ ශරීරාංග පන්සියයක් මාර්ගය දෙපස ප්‍රදර්ශනයට තැබීය. ඔවුන්ගේ සියලු රූප දීප්තිමත් වර්ණවලින් යුක්ත වූ අතර ඔවුන් ජීවතුන් අතර සිටින බව පෙනේ. මෙයින් පසු බුදුරදුන්ගේ දළදා වහන්සේ වැඩම කර, මාර්ගය මැදින් වැඩම කරන ලදි. මග යන හැම තැනම එයට පුද පූජා පැවැත් වූ අතර, මෙසේ එය අභයගිරි විහාරයේ බුද්ධ ශාලාවට පැමිණියේය. එහිදී භික්ෂූන් වහන්සේලා සහ ගිහියන් සෙනඟ රැස්ව සුවඳ දුම් දල්වා පහන් දල්වා දළදා වහන්සේ නගරය තුළ පිහිටි විහාරයට වැඩම කර දින අනූවක් ගතවන

තුරු දිවා රාත්‍රී නොනැවතී නියමිත සේවාවන් ඉටු කළහ. පෝය දිනවලදී විහාරයේ දොරටු විවෘත කරන ලද අතර, නීතිරීති වලට අනුව චාරිත්‍රානුකූල ගෞරවාන්විත ස්වරූපයෙන් නිරීක්ෂණය කරන ලදි.[10]

### ආගමේ කාර්යභාරය ගැන සමාජ විද්‍යාත්මක විග්‍රහය

ආගම පිළිබඳ සමාජ හා සමාජ මානව විද්‍යාත්මක විග්‍රහයේ දී වඩාත් අවධානය යොමුවන්නේ වර්තමානයේ පවතින දාර්ශනික හෝ සාහිත්‍යමය ආගමික ඉගැන්වීම්වලට වඩා වෙනස් වූ තත්වයකට ය. විශේෂයෙන්ම මිනිසාට නොපෙනන දේවල් හා බලවේග තේරුම් ගැනීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ආගමික සංකල්ප බිහිවීමේ පසුබිම ගැන කරුණු දැක්වේ. මැක්ස් මුලර් සමාජ විද්‍යාඥයා දැක්වූයේ මිනිසා විශ්වාස කරනු ලැබූ මිථ්‍යා දෘෂ්ටික අදහස් නම් හිරු නැගීම, හිරු බැසීම, කළුවරවීම යනාදි දේවල් තුළ පවතින ගුප්ත ස්වභාවය නිසා ඊට දේවත්වය ආරෝපණය කර පසුව පොදු විශ්වාස පද්ධතියක් ඇතිවී ඉන් පසුව ඊට වන්දනා මාන කිරීම නිසා ආගම බිහිවූ බවයි. ඊ. බී. ටයිලර් සමාජ මානව විද්‍යාඥායා ආත්මය පිළිබඳ විශ්වාසය මත ආගම බිහිවූ ආකාරය පැහැදිලි කරයි. ඒ අනුව මිනිසා විසින් මෙලොව (භෞතික ලෝකය) හා පරලොව (අධිභෞතික ලෝකය) පිළිබඳ ගොඩනගා ගන්නා වූ විශ්වාස පද්ධති සමූහය ආගමට අයත්වන අන්දම පැහැදිලි කරයි. කෙසේ නමුත් ආගම යන සංකල්පයෙහි සාර්ව භෞමික ව්‍යාප්තියත් එහි ගැඹුරත් එකිනෙක ආගම් හි ඇති සමානත්වය හා විශේෂත්වයනුත් නිසා ආගම සම්බන්ධයෙන් පැහැදිලි අර්ථ කථනයක් කිරීම අපහසු වූවකි.

ආගම[11] ගැන අදහස් හා මතවාද විවිධ විද්වතුන් මෙන්ම සමාජ විද්‍යාඥයන් හා සමාජ මානව විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කර තිබේ. මේ ගැන කරුණු දැක්වූ රැල්ෆ් එච්. ටර්නර් (Ralph H. Turner) ආගම යනු ශුද්ධ වූත් අධිස්වාභාවික වූත් දේ හා සම්බන්ධ විශ්වාස හා යාතු කර්ම වටා ගෙඩනැගුණු අන්‍යෝන්‍ය සම්බන්ධතාව ඇති තත්ත්ව කාර්යභාර හා ධර්මතා පිළිබඳ එකතුවක් යැයි පෙන්වා දී ඇත. මේවා සම්බන්ධ වී ඇත්තේ ශුද්ධ වූත් අධි ස්වභාවික වූත් දේ, විශ්වාස හා ඇදහිලි සහ ඇදහිලි වාද හා යාතු කර්ම යන අංශ ඔස්සේය. මෙහි දැක්වෙන ඇදහිලි වාද (cult) පැහැදිලි කිරීමේදී පෙරහැර පැවැත්වීමේ චාරිත්‍රය එයට අදාළ වේ.

ශ්‍රී ලාංකික සමාජයේ බෞද්ධාගම ප්‍රධාන ආගම වේ. ශ්‍රී ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ[12] විසින් දේශන කරන ලද ධර්මය එහි අන්තර්ගත ය. ඊට අමතරව ඉස්ලාම්, හින්දු, කතෝලික වැනි ආගම් ද ඒ ඒ භක්තිකයන් විසින් අදහනු ලැබේ. මෙම සෑම ආගමකටම හෝ දර්ශනයකට ම සුවිශේෂී වූ ශුද්ධ වස්තුවක් පවතියි. මෙම ශුද්ධ වස්තූන් දෙවියන් හෝ දෙවියන් සමග සම්බන්ධ වන දේවල්වලට පමණක් සීමා වී නැත. මිනිසා විසින් නිර්මාණය කරගත් ආගම් පවත්වාගෙන යනු ලබන්නේ මිනිසුන් විසින්ම ය. දෙවියන් සමග හෝ පර්වතය සමග හෝ එක්වීමට මිනිසා තුළ ආශාව ඇතිතෙක් පවතින ඕනෑම අර්ථයක් ආගම යන වචනයෙන් අර්ථ නිරූපනය කෙරෙන බවත් ආගමේ ජීවය මිනිසාගේ විශ්වාසය මත රැඳී පවතින බව ප්‍රකට වේ (විමලවංශ හිමි, 1987).

ආගම මුල් කොට පැවැත්වෙන උත්සව හෝ වන්දනාමාන පිළිවෙත් මගින් ආගමට අයිති වූ සංස්කෘතික උරුමය ගෙනහැර පායි. ශ්‍රී ලාංකික බෞද්ධ සමාජයේ පැවැත්වෙන විවිධ බෞද්ධ ආගමික උත්සව හරහා බුදුදහමේ ශාස්තෘවරයාණන් වූ ගෞතම බුදුරජාණන් වහන්සේට කෘතගුණ දැක්වීම, උන්වහන්සේ දේශන කරන ලද ධර්මය සරණ යෑම සහ මරණින් මතු ආත්මය සුගතිගාමී කර ගැනීම වැනි අරමුණු පෙරදැරිව සිදුකරනු ලබයි. සිද්ධාර්ථ කුමාරයාගේ උපත, සිදුහත් තවුසාණන් බුද්ධත්වයට පත්වීම හා සම්මා

සම්බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම යන තෙමඟුල සිහිපත් කරමින් ලොව වෙසෙන බෞද්ධ ජනතාව බොහෝ ආගමික වත් පිළිවෙත්හි නිරත වේ. එසේම ජීවමාන බුදුන් වහන්සේට සිදුකරන වන්දනය හා සමාන කොට සලකමින් උන්වහන්සේගේ සර්වඥ ධාතූන් වහන්සේලාට වන්දනාමාන කිරීම සිදු කරයි. මෙම වන්දනාමාන පිළිවෙත් හා උත්සව මගින් බෞද්ධ සංස්කෘතියේ පුනර්ජීවනය ප්‍රකට කෙරේ.

ශ්‍රී ලාංකික සමාජයේ නව සංස්කෘතික ප්‍රබෝධයක් උදෙසා පෙරහැර මංගල්‍යය ප්‍රධාන වශයෙන් ඉවහල් වේ. සමාජ විද්‍යාත්මකව මෙහි ඇති වැදගත් කාරණය වන්නේ මෙමගින් සමාජයට කිසියම් කෘත්‍යයක් (function) සිදුවීමයි. එමිල් ඩර්කයිම්[13] නමැති සමාජ විද්‍යාඥයා විසින් ආගම යනු ශුද්ධ යැ යි සම්මත විශ්වාසයන් හා භාවිතයන් සමූහයක් වටා ගෙතුණු විශ්වාසයන් හා භාවිත ක්‍රමයක් මගින් සියල්ලන්ම එක් සදාචාර ප්‍රජාවක් ලෙසට සංවිධානය කරන පද්ධතියක් ලෙස පෙන්වා දෙයි. ඩර්කයිම්ට අනුව ආගමේ මූලික ලක්ෂණ හතරක් හඳුනා ගත හැකිය. පළමුවැන්න වන්නේ සෑම ආගමකම ශුද්ධ යැ යි වස්තුවක් පැවතීම ය. බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතුව මෙන්ම ක්‍රිස්තියානි ආගමේ කුරුසය, බයිබලය ආදිය නිදසුන් ලෙස ගත හැකිය. දෙවැන්න වන්නේ එම වස්තුව පිළිබඳව ඇති විශ්වාසයයි. එම විශ්වාස පදනම් කරගෙන කරනු ලබන වත් පිළිවෙත් පැවතීම තෙවැන්නයි. එම භාවිතයන් මගින් සාමාජිකයන් එකට සංවිධානය කිරීම සිවුවැනි ලක්ෂණයයි.

එමෙන්ම තවදුරටත් ආගම මගින් සමාජයට ඉටුකරනු ලබන තවත් ප්‍රධාන කෘත්‍යයන් තුනක් ඩර්කයිම් පෙන්වා දෙයි. ආගම මගින් සමාජ සංවිධානයක් හෙවත් එකමුතු බවක් (social cohesion) ඇති කිරීම ප්‍රධාන කෘත්‍යයකි. ඩර්කයිම්ට අනුව ආගමික සංස්ථාවට විවිධ සමාජ කණ්ඩායම් එකමුතු කිරීමේ හැකියාව පවතියි. ඊට ඉවහල් වන්නේ ආගමික පුද පූජා සිරිත් විරිත් ය. මෙවැනි ආගමික වතාවත්වල දී සෑම තරාතිරමකම සමාජ කණ්ඩායම් එකමුතුවෙමින් සංවිධානය වෙමින් ඒවාට සම්බන්ධ වේ. මේ හේතුව නිසා පුද්ගලයන් අතර පවතින විෂමතා බැහැර වීම හා පොදු එකඟතාවකට පැමිණීම ඇතිවේ.

දෙවන ප්‍රධාන කාරණය වන්නේ ආගම මගින් සමාජ පාලනයක් (social control) ඇති වීමයි. ඩර්කයිම්ට අනුව ලොව ඇති හැම ආගමකින්ම පෙන්වා දෙන්නේ සමාජ විරෝධී ක්‍රියාවල නියැළීම නිසා මෙලොව හා පරලොව වශයෙන් විපාක ගෙන දෙන බවයි. මේ නිසා සිය අනුගාමිකයින් තුළ හික්මීමක් ඇති කිරීම හැම ආගමකින්ම සිදු කරයි. බුදුදහමේ පංචශීලය මගින් පුද්ගලයා පස්පවින් වළක්වා ඔහු තුළ ශික්ෂණය ඇති කිරීමට මග පෙන්වයි. මෙය සමාජයේ සිදුවන වැරදි පාලනය කිරීමට ඉවහල් වෙයි.

තෙවන කාරණය වන්නේ ආගම මගින් ජීවිතයට අර්ථයක් (Meaning to life) ලබා දීමයි. මිනිසා මුහුණ දෙන සෑම ප්‍රශ්නයකටම විද්‍යාත්මක ඥානය තුළින් පිළිතුරු සැපයිය නොහැකි බව ඩර්කයිම්ගේ අදහසයි. නිදසුනක් ලෙස කිසියම් කෙනෙකු මානසික වශයෙන් දැඩි පීඩාවකට පත්වූ විටෙක ඊට යම් සහනයක් ගෙන දීම ආගම තුළින් සිදුවේ. අනෙක් අතට ජීවිතයේ පරමාර්ථය කුමක්විය යුතුද ජීවිතය හැඩගස්වා ගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් ආගම ජීවිතවලට අර්ථයක් සපයයි (දසනායක, 2004).

### ආගමික සංවිධාන එකමුතුව සහ අන්තර් සහජීවනය

අභයගිරි පෙරහැර මුල් කොට සිදුවන තවත් වැදගත් කාරණයක් ලෙස මිනිසුන් සංවිධානමය ලෙස කටයුතු කිරීමට යොමුවීමයි. බොහෝ විට මිනිසුන් සිය එදිනෙදා ජීවිතය විඳදරාගෙන ජීවත්වීමට හුරු පුරුදුව සිටීම බෙහෙවින් දැකිය හැකි

දෙයකි. එහෙත් එය හැම අවස්ථාවකටම අදාළ නොවන අන්දම පෙරහැර සංවිධානය සම්බන්ධ කරුණු විමසන විට පැහැදිලි වෙයි. විශාල පිරිසකගේ සහභාගිත්වය ඇතිව සිදුවන කාර්යයක් සඳහා විධිමත් සංවිධානය අවශ්‍යය වූවකි. සාකච්ඡා එකෙන් අනාවරණය වූයේ අභයගිරි විහාර කේන්ද්‍ර ගතව සංවිධාන කිහිපයක් ක්‍රියාත්මක වන බවයි.

''විහාරයට සම්බන්ධ සංගම් කිහිපයක් ම තියෙනවා... ඓතිහාසික දළදා පෙරහැර කමිටුව... අනුරාධපුර කාර්ය සංවර්ධන කමිටුව... වාර්ෂික බහිරව දේව සභා කමිටුව... දායක සභා කමිටුව… දහම් පාසල... (සාකච්ඡාව-1).''

මෙසේ විහාරස්ථානය සහ ගිහි පිරිස අතර සම්බන්ධතාව ගොඩනැගීමට මූලික පදනම සපයන අවස්ථාවක් ලෙස පෙරහැර මංගල්‍යය කැපී පෙනෙයි. මෙහි ඇති සියලු කමිටුවලින් කිසියම් කාර්ය භාරයක් සිදුවූවද එහි වඩාත්ම වැදගත් සහ වගකීම් සහිත කාර්යය ඓතිහාසික දළදා පෙරහැර කමිටුව වෙත පැවරෙන බව පැහැදිලි විය. පෙරහැර දින දෙකක් පුරාවට පැවැත්වේ. එසේම විශාල ජන පිරිසකගේ සක්‍රීය සහභාගීත්වය ඇතිව එය සිදු කෙරේ. එබැවින් පෙරහැර සම්බන්ධයෙන් වැඩි වගකීම් සම්භාරයක් පවතී. ඒ අතර පෙරහැරට ඇතුළත් විය යුතු අංග සුදුසු ආකාරයෙන් පවතීදැයි සොයා බලා ඊට අවශ්‍ය ආකාරයට කටයුතු සම්පාදනය කිරීම මූලික දෙයකි.

එබැවින් පෙරහැර කමිටුව එක්රැස්වීම හා සමගිව සාකච්ඡා කිරීම හරහා ඇතිවන පොදු එකඟතාව ඒකාබද්ධතාව ගොඩනැගීමේ තවත් අවස්ථාවකි. මිනිසුන් අතර පොදු එකඟතාව ගොඩනැගීම තරමක් අපහසු වූවකි. විශේෂයෙන්ම පොදු එකඟතාවට පැමිණීමට නොහැකි සතුන් අතරින් මිනිස් සත්වයා ද මූලික වේ. එයට මූලික වන්නේ ඔහු සතු පෘතග්ජන ගති ස්වභාවය නිසාය. මමත්වය කේන්ද්‍ර කොට හැසිරෙන සතුන් අතරින් මිනිසා ද කෙනෙකි. මිනිස් සිත නිතර වෙනස් වීම සාමාන්‍ය දෙයකි. මිනිස් සිතෙහි වෙනස්වීම සමස්ත සමාජයේ වෙනස්වීම් සඳහා බලපායි. මිනිසාගේ පරිකල්පන ශක්තීන්ගේ දියුණුව නිසා ඇතිවන නව සොයා ගැනීම් මිනිස් චින්තනයේ වෙනස්කම් ඇති කරයි. එමගින් පුද්ගල ආකල්ප හා විශ්වාස ඇතුලු සමස්තයේ වෙනස්කම් සිදුවේ. වෙනස්වීම යන්න නිරතුරුවම සිදුවන ක්‍රියාදාමයකි. ග්‍රීක දාර්ශනිකයෙකු වූ හිරොක්ලීටස් (Herocletus) විසින් අචල විශ්වාසයකින් පිළිගත් ලෝකයේ විද්‍යමාන සියල්ල වෙනස් වෙමින් පවතී (Everthing is a state of flux) යැයි පැවසීය (වීරසිංහ 1999).

උක්ත ගති ස්වභාවයෙන් යුතු මිනිසා සාමූහික සමාජ සත්වයෙක් බවට පත් කිරීමට සංවිධාන චර්යාව වැදගත් කාරණයකි. එමිල් ඩර්කයිම් සමාජ විද්‍යාඥයා විසින් දැක්වූයේ මිනිසුන් සාමූහික ලෙස ක්‍රියා කිරීම නිසා සමාජ ඒකාබද්ධතාවය (social intergration) ගොඩනැගෙන බවයි. මෙමගින් සමාජයේ පැනනගින බොහෝ ගැටලු විසඳා ගත හැකි බව ඔහු වැඩි දුරටත් පෙන්වා දෙයි.

අභයගිරිය විහාරය කේන්ද්‍ර කොට පැවැත්වෙන ඇසළ පෙරහැරේ ප්‍රධානත්වය අටමස්ථානාධිපති නාහිමියන් විසින් උසලනු ලබයි. පෙරහැරට අවශ්‍ය අවවාද හා අනුශාසනා එම නාහිමියන් විසින් ලබාදේ. එසේම අටමස්ථානයට අයිති සියලු පූජනීය විහාරාධිකාරී හිමිවරුන්ගේ නොමද සහාය මෙම පෙරහැර මංගල්‍යය සඳහා ලැබේ. මේ නිසා අටමස්ථානයට අයිති විහාර අතර අන්‍යෝන්‍ය සහයෝගය තවදුරටත් වර්ධනය වීමට මෙය හේතුවකි.

මෙම පෙරහැර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අසලින් ආරම්භ වන බැව් පවත්නා තොරතුරුවලින් පැහැදිලි විය. ඉන් අනතුරුව රුවන්වැලි මහා සෑය හරහා අභයගිරි

විහාරයට ගමන් කිරීම ගැන විස්තරය පහත දැක්වේ.

''පළමු වැනි දවසේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අසලින් ආරම්භ වෙන පෙරහැර... පෙරහැර මාවත දිගේ ගමන් කරගෙන... රුවන්වැලි මහා සෑය හරහා ගිහිං.. අභයගිරියේ මාළිගාව තෙක් ගමන් කරනවා... දෙවන දවසේ පෙරහැර අනුරාධපුර නගරයේ වීථි සංචාරය කරනවා... ඉතිං මේක ලොකු සංස්කෘතික මංගල්‍යයක් (සාකච්ඡාව-2).''

පෙරහැර සඳහා අභයගිරි විහාරය මුල් වුව ද ඊට ජය ශ්‍රී මහා බෝධි බෝමලුවේ විහාරය සහ රුවන්වැලි මහා සෑ විහාරයේ සෘජු දායකත්වය ලැබෙන අයුරු හඳුනා ගත හැකිය. මෙරට බෞද්ධ ජනතාව අතර ඉතාම ඉහළ වන්දනාමානයට පාත්‍ර වූ ශ්‍රී මහා බෝධිය සහ රුවන්වැලි මහා සෑය යන සිද්ධස්ථානයන් මූලික කොට පෙරහැර ආරම්භය හා ඒ හරහා ගමන් කිරීම එක් අතකින් බෞද්ධයාගේ සිත් සතන් තුළ ජනිත වන ආගමික භක්තිය තීව්‍ර කිරීමට හේතුවේ.

#### රාජ්‍ය මැදිහත්වීම සහ ශිල්පීය දායකත්වය

ඉහත සාකච්ඡා එකෙන් හෙළිවූ අන්දමට මෙම පෙරහැර සඳහා රාජ්‍ය දායකත්වය හිමිවන අන්දම සාකච්ඡා දෙකෙන් ද හෙළිවිය. මෙරට දක්නට ලැබෙන පෙරහැර උත්සව සඳහා රජයේ මැදිහත්වීම පුරාතනයේ පටන්ම හඳුනා ගත හැකිය.[18] මහනුවර ඇසළ පෙරහැර මෙන්ම කතරගම, බෙල්ලන්විල, ගංගාරාමය සහ අනෙකුත් පෙරහැර අවස්ථාවල රජයේ මැදිහත් වීමෙන් ආරක්ෂක සේවා, ප්‍රවාහන සේවා, ජංගම ගිලන්රථ සේවාල සෞඛ්‍ය සේවා ආදිය සපයන අයුරු දැකිය හැකිය. කෙසේ වුවත් අභයගිරි විහාරයේ ඇසළ පෙරහැර උක්ත පෙරහැරවලට වෙනස් වන්නේ මෙයට පෞරාණික සිද්ධස්ථාන අටක එකතුවක් පැවතීමයි. එසේම විශාල භූමි ප්‍රදේශයක මෙම සිද්ධස්ථාන ව්‍යාප්තව පැවතීමයි. මේ නිසා සෙසු පෙරහැර වලට වඩා වෙනස් වූ අවධානයක් මෙම පෙරහැර උත්සව අවස්ථාවට යොමුවීම දකින්නට තිබේ.

පෙර රජ දවස පටන් පැවති අභයගිරි ඇසළ පෙරහැර විවිධ හේතු නිසා කිසියම් කාලයක් නොපවත්වා තිබේ. එහෙත් එහි නැවත ආරම්භය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සිදුවන සංස්කෘතික ත්‍රිකෝණ වැඩ පිළිවෙළ මුල් වෙයි.

''සංස්කෘතික ත්‍රිකෝණ වැඩසටහන පටන් ගත්තට පස්සේ තමයි මේ පෙරහැර පටන් ගත්තේ... ආචාර්ය රෝලන්ඩ් ද සිල්වා සංස්කෘතික ත්‍රිකෝණ වැඩ බිමේ අය යොදාගෙන තමයි 1980 න් පස්සේ මුල් කාලයේ මුලින්ම මේ පෙරහැර පටන් ගත්තේ... පස්සේ කාලෙදි ආචාර්ය කල්ලංචියේ රතනසිරි ස්වාමීන් වහන්සේගේ නායකත්වයෙන්... මේ පෙරහැර මහා මංගල්‍යයක් බවට පත් කළා... මේකට රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් උදව් ලබා ගන්ට උන්වහන්සේ කටයුතු කළා... (සාකච්ඡාව-3).''

පුරාවිද්‍යා කැණීම්වලින් සොයා ගන්නා ද්‍රව්‍යයන්ට කිසියම් ඓතිහාසික වටිනාකමක් ලැබෙන්නේ කෙසේද ඒ හා සමාන වටිනාකමක් දිගු කාලයක් නොපැවතුන පෙරහැර මංගල්‍යය යළිත් ආරම්භ කිරීමේ වැදගත්කම පුරාවිද්‍යාඥයන් විසින් වටහා ගෙන තිබේ. සමහර විට පුරාවිද්‍යා කැණීම්වලින් හෙළිකර ගන්නා කරුණු අතීත සාධක ස්මරණය කිරීමට වැඩියෙන් අදාළ විය හැකිය. එහෙත් පෙරහැර මංගල්‍යය වැනි සංස්කෘතික උළෙලක් හරහා පුරා විද්‍යාත්මක අගයන් ස්මරණයට පමණක් සීමා නොවී එහි ප්‍රකෘති තත්ත්වය යළි පණ ගැන්වීම පෙරහැර පැවැත්වීම තුළින් දැකගත හැකිය. මේ පසුබිම අභයගිරි ඇසළ පෙරහැර මිනිසුන්ගේ වඩාත් ආකර්ශනයට ලක්වීමට හේතු වූවකි. පසුව මෙයට රාජ්‍ය අනුග්‍රහය ලබා ගන්නා තත්ත්වයට පත් වනුයේ එම කාරණය හරහා බැව් පැහැදිලි ය.

කෙසේ නමුත් මෙරට සිවිල් යුධ ගැටුම් ආරම්භ වන්නේ ද 1980 න් පසුවයි. මෙරට සිවිල් යුධ ගැටුම් පැවති සමයේ එයින් හානි වීමට වැඩි ප්‍රවණතාවක් පැවතියේ අනුරාධපුර නගරයට ය. ශ්‍රී ලංකා හමුදාවේ සෙබළුන් හා ද්‍රව්‍යාත්මක සැපයුම් හුවමාරු නගරයක් ලෙස අනුරාධපුරය වැදගත් විය. යුධ ගැටුමෙන් පීඩාවට පත් උතුරු සහ නැගෙනහිර පළාත්වල ජීවත් වූ සිංහල මිනිසුන්ගෙන් වැඩි පිරිසක් අනුරාධපුර දිස්ත්‍රික්කය කේන්ද්‍රකොට ගෙන රැකවරණයට පිවිසීම ද සැලකිය යුතු කරුණකි. අවතැන් මිනිසුන් රැකවරණය සොයා යාමේදී සමාන ජනවාර්ගික පදනම භාවිතයට ගෙන ඇත (Pieris, 2000).

උතුරුමැද පළාතට අනන්‍ය වූ සංස්කෘතික අංග ලක්ෂණ මෙම පෙරහැරට එකතු වීම ද විශේෂ කොට සැලකිය හැකිය. උතුරු මැද පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ සංස්කෘතික ඒකකවල සෘජු මැදිහත් වීම මෙම පෙරහැර සඳහා ලබා දී තිබේ. පාසල් අධ්‍යාපනය ලබන සහ පාසල් අධ්‍යාපනය අවසන් කළ යෞවන යෞවනියන්ගේ කුසලතාවන් කලඑළි දැක්වීමට මහඟු අවස්ථාවක් මෙම පෙරහැර මගින් ලබා දී තිබේ.

''පෙරහැරට වුවමනා නර්තන කණ්ඩායම් උතුරු මැද පළාතෙන් ගන්නේ... ප්‍රාදේශීය ලේකම් මට්ටමින් සංස්කෘතික නිලධාරීන් හරහා ඒ ඒ මධ්‍යස්ථානවල පුහුණු වෙන අය මේ පෙරහැරට සහභාගි කරව ගන්නවා… මේක හොඳ අවස්ථාවක් පුහුණු වෙන අයට... ඒ විතරක් නෙවෙයි ගම් මට්ටමෙන් නාට්‍ය පුරුදු පුහුණු වෙන අයටත් මේක හොඳ අවස්ථාවක්... තම තමන්ගේ දක්ෂතා කලඑළි දක්වන්ට... (සාකච්ඡාව-3).''

පළාතේ ජීවත් වන ජනතාවගේ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය සඳහා මෙම පෙරහැර මංගල්‍යය වැදගත් වන බව පැහැදිලි වෙයි. ස්වාමීන් වහන්සේලා, පවුලේ දෙමව්පියන්, ඥාතීන්, අසල්වැසියන් රජයේ නිලධාරීන් ඇතුළු බොහෝ අය පෙරහැර නැරඹීමට පැමිණෙති. මේ සියලු දෙනා ඉදිරියේ තමන්ගේ කුසලතා එළි දැක්වීමට ඊට සහභාගි වන අයට අවස්ථාව උදාවෙයි. මෙය ඔවුන් ලබන එක්තරා භාග්‍යයකි. එබැවින් මෙයට සහභාගි වන්නන් මිල මුදල් ලාභ අපේක්ෂාවට වඩා සිය දක්ෂතා ඔප් නංවා ගැනීමට මෙය අවස්ථාවක් කර ගන්නා අයුරු සාකච්ඡා තෙවෙනි සාකච්ඡාවෙන් පැහැදිලි වෙයි.

වර්තමාන සමාජයේ ඇති දැඩි තරඟකාරීත්වය පොදුවේ සියලු දෙනාට කිසියම් මානසික මෙන්ම ශාරීරික ගැටලු ඇති කිරීමට බලපායි. සමාජයේ හැම අංශයකින්ම ඇති තරගය නිසා සමහර පුද්ගලයන් මානසික ආතතියට පත්වේ. තවත් සමහර අය මත්ද්‍රව්‍ය භාවිතයට හෝ වෙනත් අපරාධ හෝ අපචාරවලට යොමුවේ. තවත් අය සියදිවි නසා ගැනීමට පෙළඹේ. සමාජ ප්‍රශ්න මිනිසුන්ට සහ සමාජයට නිශේධනාත්මකව බලපායි. එනම් දුෂ්කෘත්‍යයක් සිදුවීමයි. එයින් සමාජයට අගතිගාමී ප්‍රතිඵල ගෙනවිත් දෙයි. එසේම මෙය සමාජයේ යහපත් පැවැත්මට හානිකර ප්‍රතිඵල ගෙනවිත් දෙයි (වීරකෝන් 2020, 232). මෙවැනි සංකීර්ණ වටපිටාව සහිත සමාජයක මානසික සංතෘප්තිය සඳහා පමණක් නොව සිය කුසලතා එළි දැක්වීමට පෙරහැර මංගල්‍යය තුළින් ඉඩ ලබාදීම මිනිසුන්ගේ සැනසිල්ලට හේතුවේ.

### දන්සැල් පැවැත්වීම

ශ්‍රී ලංකාවේ වෙනත් පළාත්වල ජීවත් වන මිනිසුන් පෙරහැර මංගල්‍යයට නන් අයුරින් දායක වන බව දැකිය හැකි විය. දන්සැල් පැවැත්වීම එහි ප්‍රධාන කටයුත්තකි. ව්‍යාපාරික මට්ටමේ හෝ වෙනත් සංවිධාන මට්ටමේ පුද්ගලයන්ගේ එකමුතුවෙන් පෙරහැර නැරඹීමට පැමිණෙන බැතිමතුන්ට ආහාරපාන, ඔසු පැන් මෙන්ම මල්, සුවඳ කූරු ආදිය නොමිලයේ බෙදාදීම ගැන

තොරතුරු අනාවරණය විය.

''පෙරහැර දවස්වල පිටින් ඇවිත් මෙහේ දන්සැල් දෙනවා... බීම, බත්, නූඩ්ල්ස්, මඤ්ඤොක්කා, මල් දන්සැල් දෙනවා... රජයේ මුද්‍රණ සංස්ථාව... එලිෆන්ට් හවුස් වගේ ආයතන මගිනුත් දන්සැල් දෙනවා... එයාලා ඉතිං වෙළඳ ප්‍රචාරයක් විදියටත් මේක කරනවා... (සාකච්ඡාව-3).''

වර්තමාන සමාජය ධනවාදී සමාජ මුහුණුවර ගත් එකකි. එහි වඩා වැදගත් සාධකය බවට ලාභ පරමාර්ථය මූලික වේ. ව්‍යාපාරික මට්ටමේ ආයතන දන්සැල් පැවැත්වීම මගින් සිය වෙළෙඳ ප්‍රචාරණයක් අපේක්ෂා කරන බව පැහැදිලි වෙයි. ඔවුන් විසින් වැඩි ආර්ථික පිරිවැයක් දරමින් කාලය හා ශ්‍රමය කැප කිරීම හරහා මෙවැනි ආයතනයන්හි ලාභ පරමාර්ථයක් අපේක්ෂා කිරීම සාධාරණ ය. විධිමත් ආයතන පද්ධතියක් මගින් දන්සැල් ලබාදීම තුළ සමහර විට ලෝකෝත්තර අරමුණුවලට වඩා ලෞකික අපේක්ෂා වැඩියෙන් තිබෙන්නට පුළුවන. සිය ආයතනයේ කීර්තිනාමය ඉහළ නැංවීම හෝ වෙළඳ ප්‍රචාරණය ලබා ගැනීම වැනි අපේක්ෂා පැවතිය හැකිය. එම අරමුණු කවරක් වුව ද මෙවැනි දානමය කටයුතු සත්ක්‍රියා වේ. එයින් මිනිසුන් ප්‍රතිලාභයක් ලබනවා පමණක් නොව මිනිසුන් විසින් ලබාදෙන ආශීර්වාදය වැදගත් එකකි. එනම් නොදන්නා සමූහයක් වෙත මිනිසුන්ගේ ආශීර්වාදය පිරිනැමීමයි. එසේම අදාළ ආයතන වෙත මිනිසුන් වැඩි නැඹුරුවක් දැක්වීම සිදුවිය හැකිය. මේ නිසා පෙරහැර පැවැත්වීම හරහා මිනිසුන්ට වෙළෙඳපොළ සම්බන්ධතාව ගොඩනැගීමට කිසියම් නිළීන (මතු පිටට නොපෙනෙන) දායකත්වයක් ලබා දෙයි. සමාජ විද්‍යාඥයෙකු වූ නිව්ටන් ගුණසිංහ විසින් මහනුවර ගම්මාන දෙකක් වූ දෙළුම්ගොඩ හා යදකාගම යන ගම් ඇසුරින් සිදුකළ අධ්‍යයනයක දී පෙන්වා දුන්නේ ග්‍රාමීය මිනිසුන් වෙළඳපොළ සමග සම්බන්ධ වන්නේ සිය අතිරික්තය අලෙවි කිරීමට යාම හරහා බවයි (Gunasinghe 1990).

පළාතේ ජීවත් වන ජනතාව විසින් ද දන්සැල් ලබා දෙන බැව් අධ්‍යයනයෙන් හෙළිවිය. ඒ සඳහා ස්වභාවික පරිසරයේ දෑ භාවිතයට ගැනීමට බෙහෙවින් යොමුවී සිටින බව පැහැදිලි විය. මොවුන් දන්සැල් ලබාදීමේ අදහස කල්තියා හඳුනාගෙන සිටියි. දළදා පෙරහැර සේම එක් එක් විශේෂිත පොහොය දිනවල කවර අන්දමේ දන්සැලක් පැවැත්විය යුතුද යන්න වේලාසනින් තීරණය කර තිබේ.

''මෙහේ ඉන්න අය දන්නවා අහවල් පෝයට මේ වගේ දන්සැල් දෙන්ට ඕනෑ කියල... ඒකට පුරුදු වෙලා ඉන්නවා... මෙහේ වැව්වල එක එක වර්ගවල මල් ජාති තියෙනවා... ඉතිං ඒවා කඩාගෙන ඇවිත් තියං බෙදල දෙනවා… මෙච්ච නං ප්‍රචාරය බලාගෙන කරන එව්වා නෙවෙයි... පිං පතාගෙන කරන එව්වා... සාමාන්‍ය පිරිසක් වෙනත් කෑම බීම දන්සැල් එහෙමත් දෙනවා ඒකටනං ඉතිං පොසොන් පොහොය විශේෂයි... මිහින්තලේ තමා වැඩියෙන් තියෙන්නේ... (සාකච්ඡාව-3).''

මිනිසුන්ට පරිත්‍යාගශීලී වීමේ ඉඩකඩ පෙරහැර තුළින් විවර කර තිබේ. මෙම පළාත් වැසියන්ට නාගරික ව්‍යාපාරික ප්‍රජාව මෙන් මහා පරිමාණයේ දන්සැල් පුද්ගලික වියදමින් දීමේ දුෂ්කරතා සමහර විට පැවතිය හැකිය. එහෙත් දන්සැල් දීමේ වැඩ පිළිවෙළ මොවුන්ගේ පිළිගැනීමට ලක්වූවකි. ඊට පහසු ආකාරයේ ක්‍රම එම අය විසින් භාවිත කර ඇත. උතුරු පළාත වූ කලී වැව් විශාල වශයෙන් පිහිටි ප්‍රදේශයකි. මෙම පළාතේ බොහෝ ගම්වල නම සෑදී ඇත්තේ වැවක නමක් සම්බන්ධ කරගෙනය. වැව් සංස්කෘතිය සිංහල බෞද්ධ ජනතාවට සමීප බව දැක්වෙන ඓතිහාසික තොරතුරු පවතී. පුරාණයේ වැව් වර්ග තුනක් ගැන තොරතුරු හෙළිවේ. පළමුව ගම් මට්ටමෙන් ඉදිකළ කුඩා වැවක් වූ ගමික වැව ඇත. දෙවනුව විශාල වැවකින් ඇළ මාර්ග ඔස්සේ ජලය රැස්කර බෙදාහරින මධ්‍යම ප්‍රමාණයේ

දානවැව ගැනේ. තුන්වැන්න විශාල ප්‍රදේශයක ජලය හා කෙත් වතු සඳහා ජලය සැපයෙන මහවැව යි (සුරවීර, 2000). මෙම වැව්වලින් එක්රැස් කර ගන්නා නෙළුම්, මානෙල්, ඕළු වැනි මල් එකතු කොට දන්සැල් වශයෙන් බෙදා දීම හරහා මිනිසුන් අතර අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය වීමට හේතුවේ.

## ඇසළ පෙරහැර සහ සංඛ හා පද්ම බහිරව දේව ඇදහිල්ල

අභයගිරි ඇසළ පෙරහැර සම්බන්ධ ප්‍රධාන දේව ඇදහිලි අංගයක් වන්නේ සංඛපද්ම බහිරව දේව ඇදහිලි අංගයයි. දේව වන්දනය[19] මෙරට පැවැත්වෙන බෞද්ධ පෙරහැරවලට එකතුවීම මුල් යුගයේ සිටම සිදුවුවකි. මහනුවර යුගය ආරම්භයෙන් පසුව දළදා පෙරහැර මංගල්‍යයෙහි යම් වෙනසක් දැකිය හැකිය. මේ කාලයේදී දළදා වහන්සේ වෙනුවෙන් පැවැත්වූ පෙරහැර අහෝසි වී දේවාල පෙරහැර පමණක් ඉතිරිවීම හඳුනා ගැනීමට පුළුවන. රොබට් නොක්ස් නමැති ඉංග්‍රීසි ජාතිකයා දෙවන රාජසිංහ රජුගේ පාලන යුගයේ (ක්‍රි. ව. 1635-1687) මහනුවර රාජධානියෙහි සිරකරුවෙකුව සිටි කාලයෙහි (1660 අප්‍රේල් 04 දින සිට 1679 ඔක්තෝබර් 18 දක්වා කාලය) පැවැත්වූ ඇසළ පෙරහැර දෙවියන් උදෙසා පැවැත්වූ දේව පෙරහැරක් ලෙස පෙන්වා දී තිබේ. "දෙවියන් හට ස්තෝත්‍ර පවත්වා දේවානුකම්පාව ලබා ගැනීමේ පරමාර්ථයෙන් ජූනි හෝ ජූලි යන මාසවල අමාවක් පොහොය දින ඒ ඒ දේවාලයන්හි දේව පූජෝත්සවයක් ගරු ගාම්භීර ලෙස පවත්වනු ලැබේ. මෙම උත්සව අතුරින් අතිවිශිෂ්ට උත්සවය පැවැත්වෙන්නේ කන්දේනුවර (මහනුවර) යි. මෙයට මහනුවර ඇසළ පෙරහැරයැ යි කියනු ලැබේ. මෙම උළෙළ අමාවක දා පටන් පුරපසළොස්වක් දා දක්වා සකල උත්සව ශ්‍රී විභූතියෙන් යුක්තව පවත්නේය. අලුත් නුවර දෙවියන්, කතරගම දෙවියන් හා පත්තිනි දෙවියන් වෙනුවෙන් කපුවෝ පෙනී සිටින්නාහ." යනුවෙන් සඳහන් වේ (කරුණාරත්න 1972: 237).

සංඛ හා පද්ම යන බහිරව දේව ඇදහිල්ල අභයගිරි පුරාණ විහාරයට විශේෂිත සංස්කෘතික ලක්ෂණයකි.[20] සම්මුඛ සාකච්ඡා එකෙන් හෙළිවූයේ අභයගිරි විහාරයට අදාළ සංවිධාන අතර වාර්ෂික බහිරව දේව සභා කමිටුව ද මූලික එකක් බවයි. එබැවින් සංඛ පද්ම දේව වන්දනය විහාරය හා සම්බන්ධ ප්‍රධාන ආගමික චාරිත්‍රයක් බව පැහැදිලි වෙයි. මෙම බහිරව දෙවියන් අභයගිරි විහාරයට සම්බන්ධ වීම ගැන තොරතුරු ජන ව්‍යවහාරයේ එන බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

''ජන සම්මතයක් ලෙසට ජනවහර අනුව අභයගිරි ස්ථූපය හදන්ට දීල නෑ... භූමිය අරක්ගත් බහිරවයෝ කඩනවා... කුවේරගේ ධන නිධාන ආරක්ෂා කරන සංඛ පද්ම බහිරවයන් දෙන්නා... ඊට වුවමනා විධියට පූජා පවත්වලා බාරහාර වෙලා ස්ථූපය හදලා තියෙනවා... සංඛ රතු පාට - පද්ම සුදු පාට… රතුපාට කෙනා සැර... ඉදිකිරීම් වලදී වැඩියෙන් බාර වෙන්නේ සංඛට රතු සැර නිසා... (සාකච්ඡාව-4)''

භූමියට අරක්ගත් බහිරව දෙවියන් පිළිබඳ ජන විශ්වාසය අභයගිරි විහාරයේ ඉදිකිරීම් මුල් අවස්ථාව හා සම්බන්ධ වන බව පැහැදිලි වේ. පොළොව තුළ කිසියම් වටිනාකම ඇති ධන නිධාන පිළිබඳ අදහස් මෙන්ම ඒවාට හිමිකම් ඇති අය ගැන අදහස් මෙයින් විද්‍යමාන කෙරේ. ධනයේ දෙවියා ලෙස සැලකෙන කුවේරගේ සේවකයන් වන වාමනයන් දෙදෙනෙකු මුරගල්වලින් නිරූපණය කරයි. කාලිදාස විසින් රචිත වීර කාව්‍යවලට අනුව වාමනයන් දෙදෙනා (කුවේරගේ ආරක්ෂකයන් වන) සංඛ හා පද්ම යන නම්වලින් හැඳින්වූහ. වාමනයන් ධනය ආරක්ෂා කරන බව විශ්වාස කරන අතර ඔවුන්ට භාර දුන් සෑම දෙයකම එකම ආරක්ෂකයින් විය. සාහිත්‍යයේ වාමනයන් පෘථිවියේ ආරක්ෂකයින් ලෙස විස්තර කෙරේ. විශේෂයෙන් රජෙකු විසින් තබා ඇති නිධානයක ආරක්ෂකයන් සත්ව බිලි

පූජාවෙන් සෑහීමට පත්වන යක්ෂ පිරිසක් ලෙස ඔවුන් තවදුරටත් විස්තර කෙරේ. ඒවායේ ආරෝපණය කරන වින්දනය පෙන්නුම් කරන විදින ඇස් ඇති, මුට්ටි බඩ බරැති අත් පා සහ තද හිසකින් සමන්විත වේ.[21]

මෙයින් පැහැදිලි වන්නේ අභයගිරි ස්ථූපය ගොඩනැගුණු ස්ථානයේ කිසියම් අදෘශ්‍යමාන බලයක් පැවති බවය. එනම් මෙම භූමිය පුරාතන අතීත රජවරුන්ගේ නෙත ගැටුණු හා භාවිතයට ගැනුණු ස්ථානයක් වන බවයි. මේ නිසා මෙම පුද බිම ගෞතම බුදුන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතුව වැඩමවීම සඳහා සුදුසු ස්ථානය වන්නට ඇත. එසේම සමකාලීන ලක් වැසියන් බහිරව දෙවියන් පිළිබඳ විශ්වාසය ගොඩනැගීම හා එහි වර්ධනය සඳහා මෙම සිදුවීම් වැදගත් මූලාශ්‍රයක් වූවා නිසැකය.

වර්තමානයේ ප්‍රදේශයට පමණක් නොව රටේ වෙනත් පළාත්වල මිනිසුන් මෙම සංඛ පද්ම බහිරව දෙවියන්ගේ පිහිට ආරක්ෂාවට පැමිණෙන අන්දම ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී දැකගත හැකිවිය. මෙහි පූජා කටයුතු සඳහා වෙන්වූ දේවාලය සහ කපු මහතෙකු සිටියි. බහිරව පූජා පැවැත්වෙන දින වකවාණු සහ එම පූජාවට වුවමනා කෙරෙන භාණ්ඩ ලැයිස්තුව එහි ඉදිරි පස බිත්තියෙහි ප්‍රදර්ශනය කර ඇත.[22]

**නිගමන**

රාජ්‍ය පාලන තන්ත්‍රය සහ බෞද්ධ සමාජය අතර අන්තර් සම්බන්ධතාවක් ගොඩනැගීමට අභයගිරි පෙරහැර මංගල්‍යය ඉවහල් වී තිබේ. සමාජයේ සිදුවිය යුතු සමාජයීය හා ආගමික ඉදිරි ප්‍රතිශෝධන සඳහා පියවර ගැනීමට මෙමගින් ඉඩකඩ විවර වී තිබේ.

පෙරහැර සංවිධානය සඳහා තිබෙන කමිටු හෝ සංවිධාන ව්‍යුහය පුද්ගලයන් එක්රැස්වීමට අවස්ථාව උදාකර ඇත. මෙමගින් විවිධ අදහස් ඇති පුද්ගලයන් පොදු එකගතාවකට ගොණුකර තිබේ. මෙය සමාජයේ අන්තර් සහයෝගිතාව ඇතිවීමට හේතුවකි.

අටමස්ථානයට අයිති සියලු පූජනීය විහාරාධිකාරී හිමිවරුන්ගේ නොමද සහාය මෙම පෙරහැර මංගල්‍යයට ලැබී ඇත. මේ නිසා අටමස්ථානයට අයිති විහාර අතර අන්‍යොන්‍ය සහයෝගය තවදුරටත් වර්ධනය වීමට මෙම පෙරහැර මංගල්‍යය උපකාරී වී ඇත.

මෙම පෙරහැරට සහභාගිත්වය තුළින් උතුරු මැද පළාතේ වෙසෙන දක්ෂතා සහිත අයගේ කුසලතා එළි දැක්වීමට අවස්ථාව ලැබී තිබේ. පුද්ගල දක්ෂතා එළි දැක්වීමට පමණක් නොව එය ඇගයුමට ලක් වීම සිදුවේ. එබැවින් සිය දක්ෂතා වැඩි දියුණුව සඳහා මෙන්ම නවකයින් දිරි ගන්වනු ලබන අවස්ථාවක් ලෙස පෙරහැර මංගල්‍යය පෙන්වා දිය හැකිය.

පවුලේ සාමාජිකයන් අතර මෙන්ම අසල්වැසි මිනිසුන් අතර පවතින බැඳීම තවත් ශක්තිමත් කිරීමට පෙරහැර දායක වී තිබේ. පවුලේ සාමාජිකයන් අතර අන්තර් බැඳියාව ශක්තිමත් වීම බෙහෙවින්ම යහපත් සමාජානුයෝජනයකට ඉවහල් වේ. එසේම සමාජයේ සාමාජිකයන් අතර පවතින සම්බන්ධතාව ප්‍රකෘතිමත් වීම හරහා සමාජය නැවත අලුතින් සකස් වේ.

පෙරහැර සමයෙහි පවත්වන දන්සැල් දායකයන් බෙහෙවින්ම කොළඹ හෝ වෙනත් නාගරික ප්‍රදේශවලින් පැමිණි ව්‍යාපාරික හෝ ඊට සම්බන්ධ පිරිසකි. නගරයේ ලක්ෂණ මෙම පළාත වෙත ආගමනය වීම දන්සැල් වැඩ පිළිවෙළ හරහා ද සිදුවේ. උතුරු පළාත් වැසියන් පිරිසක් පුළුල් වෙළෙඳපොළ සමග සම්බන්ධ කිරීමේ කාර්යය මෙම දන්සැල් ලබාදීම හරහා වක්‍ර ආකාරයෙන් සිදුවේ.

නාගරික වැසියන් විසින් විවිධ ආහාර වර්ග ද, උතුරු පළාතේ වැසියන් විසින් විවිධ මල් වර්ග ද දන්සැල් පවත්වමින් නොමිලයේ ලබා දීම දක්නට ලැබුණි. මෙම පෙරහැර මංගල්‍යය නිසා මිනිසුන්ට පරිත්‍යාගශීලී වීමේ ඉඩකඩ විවර කර ඇත.

ශ්‍රී ගෞතම බුදුන් වහන්සේට සම්බන්ධ එක් පූජනීය ස්ථානයක් පමණක් නොව පූජනීය ස්ථාන අටක් ස්ථාපිතව වී ඇති පුද බිමක පැවැත්වෙන පෙරහැර මංගල්‍යය බෞද්ධයාගේ සිත් සතන් තුළ බුද්ධාලම්භන ප්‍රීතිය තීව්‍ර කර තිබෙන බව පැවසිය හැකිය.

භූමියට අරක්ගත් බහිරව දෙවියන් පිළිබඳ විශ්වාසය මිනිසුන් තුළ ස්ථාපිත කිරීම හෝ වර්ධනය කිරීම සඳහා අභයගිරි විහාරය හා සම්බන්ධ සංඛ-පද්ම බහිරව ඇදහිල්ල ද හේතුවකි. අභයගිරි පුරාණ විහාරය මුල්කොට පැවැත්වෙන ඇසළ පෙරහැර මංගල්‍යයට දේව ඇදහිලි අංග එකතුවීම සඳහා සංඛ පද්ම බහිරව දේව ඇදහිල්ල බලපා තිබේ.




ඡායාරූපය-1

අභයගිරි විහාරයේ ස්ථාපිත ෆාහියන් පිළිරුව




මූලාශ්‍රය: https://www.dreamstime.com/royalty-free-stock-photo-abhayagiriya-dagoba-anuradhapura-sri-lanka-image11291295



ඓතිහාසික අභයගිරි රජමහා විහාරස්ථ සංඛ-පද්ම
භෛරව දෙවිවරු උදෙසා තබන පූජා බඩු ලැයිස්තුව

බාරයක් වීම සඳහා අවශ්‍ය පූජා ද්‍රව්‍ය

තෙල්, මල්, පහන්, සුවඳ දුම් ආදිය බුදුරජාණන් වහන්සේපූජා කොට භෛරව පූජාව තැබීම වඩාත් සුදුසුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1- තැඹිලි ගෙඩි | 02 යි. | 7- රතු රෙදි මීටර් | 02 යි. | 13- පඬුරු කාසි | 42 යි. |
| 2- කැකුළු හාල් කිලෝ | 02 යි. | 8- වඬේ හෝ කඩල පැකට් | 02 යි. | 14- පොල්තෙල් බෝතල් | 1/2 යි. |
| 3- පොල් ගෙඩි | 02 යි. | 9- පළතුරු වර්ග (2 බැගින්) | 05 යි. | 15- හඳුන්කූරු පෙට්ටි | 02 යි. |
| 4- කිතුල් හකුරු බෑ | 02 යි. | 10- කැවිලි වර්ග (2 බැගින්) | 05 යි. | 16- කපුරු පොඩි පැ. | 02 යි. |
| 5- කෙසෙල් ඇවරි | 02 යි. | 11- බුලත් | 42 යි. | 17- සාම්බ්‍රානි ග්‍රෑම් | 25 යි. |
| 6- සුදු රෙදි මීටර් | 02 යි. | 12- පුවක් | 42 යි. | 18- මල් (රතු/ සුදු) | |

❖ දැකුම් පඬුරු රු. 200/-

බාරයක් ඔප්පුවීම සඳහා අවශ්‍ය පූජා ද්‍රව්‍ය

අට පිරිකරක්, සිවුරක්, ඇඳනයක්, වෙනයම් පිරිකරක්, අභයගිරි දාගැබ් වහන්සේගේ සංවර්ධන කටයුතු සඳහා ආධාර මුදලක් හෝ සර්ව රාත්‍රික විදුලි පහන් පූජාවක් පවත්වා උදේ කිරි ආහාර, දහවල් බුද්ධ පූජාව, සවස ගිලන් පස පූජාවක් යන අවස්ථාවට උචිත වන පරිදි පූජාවක් සකස් කරගෙන තෙල්, මල්, පහන්, සුවඳ දුම් ආදිය බුදුරජාණන් වහන්සේට පූජා කොට භෛරව පූජාව ඔප්පු දීම වඩාත් සුදුසුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1- තැඹිලි ගෙඩි | 02 යි. | 7- රතු රෙදි මීටර් | 02 යි. | 13- පඬුරු කාසි | 42 යි. |
| 2- කැකුළු හාල් කිලෝ | 02 යි. | 8- වඬේ හෝ කඩල පැ. | 02 යි. | 14- පොල්තෙල් බෝතල් | 1/2 යි. |
| 3- පොල් ගෙඩි | 02 යි. | 9- පළතුරු වර්ග (2 බැගින්) | 05 යි. | 15- හඳුන්කූරු පෙට්ටි | 02 යි. |
| 4- කිතුල් හකුරු බෑ | 02 යි. | 10- කැවිලි වර්ග (2 බැගින්) | 05 යි. | 16- කපුරු පොඩි පැ. | 02 යි. |
| 5- කෙසෙල් ඇවරි | 02 යි. | 11- බුලත් | 42 යි. | 17- සාම්බ්‍රානි ග්‍රෑම් | 25 යි. |
| 6- සුදු රෙදි මීටර් | 02 යි. | 12- පුවක් | 42 යි. | 18- මල් (රතු/ සුදු) | |

❖ දැකුම් පඬුරු රු. 500/-

සෑම දිනකම උදේ 8.00 සිට රාත්‍රී 08.00 දක්වා පූජා පැවැත්වේ.

අභයගිරි රජමහා විහාරය, පූජනීය පෙදෙස, අනුරාධපුරය. (ටෙලි-025 2235898)

ඡායාරූපය - 3

වර්තමානයේ සංඛ පද්ම බහිරව දෙවිවරු උදෙසා තබන පුද පූජා බඩු ලැයිස්තුව

**සම්මුඛ සාකච්ඡා පැවැත් වූ අය**

පූජ්‍ය ආචාර්ය කල්ලන්චියේ රතනසිරි හිමි, විහාරාධිකාරී, අභයගිරි පුරාණ විහාරය, අනුරාධපුරය

ශාස්ත්‍රපති පූජ්‍ය කිරින්දේ ඥානදර්ශන හිමි, බෝමළුව විහාරය, අනුරාධපුරය

ටී. ඒ. සෙනෙවිරත්න, ව්‍යාපෘති කළමණාකරු,

අභයගිරිය ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය

ඊ. ඩී. රම්‍යලතා, පුරාවිද්‍යා සංරක්ෂණ නිළධාරී, අභයගිරිය කෞතුකාගාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය

ඉරේෂා උදයන්ති, අංක 724, අනුලා මාවත, අනුරාධපුරය

## මූලික තොරතුරු සැපයූ අය

රන්ජන ප්‍රේමනාත් ජයසිංහ, ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, උතුරු මැද පළාත, අනුරාධපුරය

එස්. සී. සේනාරත්න, උපගුරු, තම්මැන්නාව වීරසුමන විදුහල, තම්මැන්නාව, මිහින්තලේ

## ආන්තික සටහන්

1. ඉංග්‍රීසි භාෂාවේ එන ''කල්චර්'' (culture) යන වචනයේ තේරුම දීමට සංස්කෘතිය යන පදය සිංහල භාෂාවේ භාවිත වේ. සංස්කෘතිය යන වචනය සිංහල ව්‍යවහාරයට පැමිණ තවමත් අවුරුදු පනහකට හැටකට වඩා වැඩි නැත. රේමන්ඩ් විලියම්ස් (Raymond Williams) ට අනුව ''කල්චර්'' යන්න ඉංග්‍රීසි භාෂාවෙහි ඇති අත්‍යන්තයෙන් සංකීර්ණ වචන දෙක තුනෙක් එකකි. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට අනුව ලතින් භාෂාවේ ''කොලෙරේ'' (Colere) යන වදනින් නිපන් ''කුල්ටුරා'' (cultura) යන පදයෙන් ඉංග්‍රීසි භාෂාවේ ''කල්චර්'' යන වචනය සකස්ව ඇත. ''කල්චර්'' යන්නෙහි මුල් අරුත වූයේ වගාව නැඹුරුව පිදීම යන්නයි.

කුමාර එන්. වී. ජී. ඒ. එච්., සමාජ විද්‍යාව මූලික සංකල්ප, න්‍යාය හා ක්‍රමවේදය, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව, 2008, පිටුව. 189

2. සාමූහික සමාජ සම්බන්ධතාවලින් සැදුම්ලත් සාර්ව ඒකකය සමාජය ලෙස හැඳින්වේ. සමාජය යන්න සංකීර්ණ ඒකකයකි. පුද්ගලයාගේ සමාජ ක්‍රියාව හා සමාජ අන්තර් ක්‍රියාව පදනම් කරගෙන සමාජය ගොඩනැගී තිබේ. සමාජය මානව සම්බන්ධතා ජාලයකින් නිර්මාණය වූවකි. මානව ක්‍රියාකාරකම් වූ සාරධර්ම, ප්‍රතිමාන, ඇගයුම්ල විශ්වාස සමාජය තුළ පවතී. සමාජය යනු අභ්‍යන්තර සංවිධානයල ප්‍රාදේශිකත්වයල සංස්කෘතික විශේෂත්වය, ස්ත්‍රී පුරුෂ වශයෙන් පුද්ගලයන් සමාජයට බඳවා ගැනීම සහ සාපේක්ෂ වශයෙන් ස්වාධීන නැතහොත් ස්වයංපෝෂිත ප්‍රජා සමූහයකි (Encyclopeadia of social sciences).

3. ගුහසීව රජු සටනින් පරාජය වූ අතර ඔහුගේ දියණිය වූ හේමමාලා හා බෑණනුවන් වූ දන්ත කුමාරයා ආඬි වෙස් ගෙන දළදා වහන්සේ ද සඟවා ගෙන ලංකාවට ඒමට සමත් විය. සතුරු උවදුරු වලින් බේරීම සඳහා හේමමාලා කුමරිය ශ්‍රී දළදා වහන්සේ සිය කෙසේ කළඹෙහි සඟවාගෙන ආ අතර ඒ එන ගමනේදී ඔවුන් විවිධ දුෂ්කරතාවලට මුහුණ පෑ බව දළදා සිරිතෙහි විස්තර වේ. බොහෝ දුරක් පයින් ගමන් කර තුත්තුකුඩියේ සිට පැමිණි වෙළඳ නැවකින් ඔවුහු ලංකාවට පැමිණියහ. එකළ මහසේන රජු මිය ගොස් ඔහුගේ පුත් මේඝවර්ණාභය ලංකාවේ රාජ්‍ය කරවීය. දළදා වහන්සේ රැගෙන පැමිණි හේමමාලා හා දන්ත කුමරු ලංකාවේ පළමුව නවාතැන් ගන්නේ මේඝගිරි විහාරය හෙවත් ඉසුරුමුණි විහාරයේ බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතයයි. ඉසුරුමුණි විහාරය දෙවන පැතිස් රජතුමා විසින් කරවන ලද්දකි.

ශ්‍රී සුමංගල නාහිමි සහ බටුවන්තුඩාවේ දේව රක්ඛිත, (සංස්) මහාවංශය දෙවන භාග, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹල 1996

4. සාම්ප්‍රදායික වංශකථාවන්ට අනුකූලව ලංකාවට බුදුදහම හඳුන්වා දී ඇත්තේ දෙවන සියවසේ ඉන්දියාවේ විසූ අශෝක අධිරාජ්‍යයාගේ පුතුන් වූ හින්ද මහා රහතන් වහන්සේය. එවකට ලංකාව පාලනය කළ දේවානම්පියතිස්ස රජුන්හට භාර වී තිබිණි. මේ කාලය තුළදී ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් ද වැඩම කරන ලදී. ශ්‍රී ලංකා රජුන්ගේ අනුග්‍රහය ඇතිව මුල්ම ආශ්‍රමය බිහිවිය. ඒ වාගේම පාලි පොත් ලියවීම ආරම්භ විණි. දෙවන සියවසේදී බුදු දහම හඳුන්වා දීමෙන් අනතුරුව එය වැඩිම කාලයක් ව්‍යාප්ත වූයේත් සහ සංඝයා වහන්සේලා වැඩි ප්‍රමාණයක් බිහිවූයේ ලංකාවේ පමණි. එම තත්ත්වය හීන වූ අවස්ථාවල මියන්මාරයෙන් සහ තායිලන්තයෙන් පැවිදි පෙලපත් ඇඳා ගන්නා ලදී. මහායාන ධර්මය ඇතිවීමත් සමග ථෙරවාද බුදුදහමේ පැවැත්මට යම්කිසි බලපෑමක් ඇතිවූ නමුත් ථෙරවාද ධර්මය අවුරුදු 2000කටත් වඩා ශ්‍රී ලංකාවේ ප්‍රචලිතව ඇත. මුලින්ම ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූයේ ථෙරවාදී බුදු දහමය. ජනගහනයෙන් 70% ථෙරවාදී බුදුදහමේ අනුගාමිකයෝ වෙති. දීපවංශය වැනි වංශකතාවල සඳහන් වන පරිදි ශ්‍රී ලංකාවේ දේවානම්පියතිස්ස රජතුමාගේ කාලයේ අශෝක අධිරාජ්‍යයාගේ පුත් මහින්ද තෙරුන් ක්‍රි. පූ. 2 වැනි සියවසේදී ලංකාවට බුදුදහම ගෙන එන ලදී. මෙම කාලය තුළදීම ශ්‍රී මහා බෝධි අංකුරය ද ලංකාවට වැඩම කරන ලද අතර රජුගේ අනුග්‍රහය ඇතිව ප්‍රථම ආරාමයක් පිහිටුවන ලදී. එතෙක් පාලි භාෂාවෙන් කට පාඩමින් රැකගෙන ආ

ධර්ම කරුණු ක්‍රි. පූ. 30 දී පමණ ලේඛණාරූඪ කරන ලදී. https://en.wikipedia.org/wiki/Buddhism_in_Sri_Lanka

5. 1979 වසරේදී ආරම්භ වූ මෙම පෙරහැර උත්සවය අතර ගිනි නැටුම්, කසකරුවන්, කොඩි ගෙන යන්නන් සහ බොහෝ අලි ඇතුන් යොදා ගන්නා අතර උඩරට, පහත රට සහ සබරගමුව වැනි විස්මිත සම්ප්‍රදායික නැටුම්වලින් ද, බෙර වාදනය, නළා පිඹීම සහ විවිධ නර්තනවලින් මෙම පෙරහැර සමන්විතය.

6. ඡායාරූපය 1 - අනුරාධපුර අභයගිරි විහාරයේ ස්ථාපිත කර තිබෙන ෆාහියන් පිළිරුවෙහි ඡායාරූපය, පිටුව 19

7. එකල අනුරාධපුරයේ පැවති ප්‍රබලතම භික්ෂු නිකායන් දෙක වන මහා විහාරයත් අභයගිරියත් අතර පැවති අසමගිකම් නිසා ඒ දෙපාර්ශ්වයට ම අයිති විහාරයක දළදා වහන්සේ තැන්පත් නොකොට කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු විසින් තමන්ටම අයිති ගොඩනැගිල්ලක දළදාව තැන්පත් කරන්නට හේතුවන්නට ඇත. වජිර හිමි, කඹුරුගමුවේ, දළදා ඉතිහාසය සහ සංස්කෘතිය, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2008

8. එකොළොස්වන සියවසේ ඇති වූ සොළී ආක්‍රමණ නිසා අනුරාධපුර රාජධානිය පොළොන්නරුවට මාරු විය. දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතය වශයෙන් සලකා කටයුතු කළ බැවින් එය පොළොන්නරුවට වැඩම කරවීමට කටයුතු කර ඇත.

9. ශ්‍රී ලංකාවෙහි ඉපැරණි අගනුවර වූ අනුරාධපුරයෙහි පැරණි රජ මාළිගය ආදිය පිහිටි ඇතුලු නුවරටත් ප්‍රථම බෞද්ධ ආරාමය වූ මහා විහාරයටත් උතුරින් පිහිටි හෙයින් උත්තර විහාර නමින් ද හැඳින් වූ අභයගිරි විහාරයේ ඉදිකිරීම ආරම්භ කරන ලද්දේ ක්‍රි. පූ. පළමුවන සියවසේ වළගම්බා රජතුමා විසිනි. සමකාලීනව දකුණු ඉන්දියානු ආක්‍රමණයක් අනුරාධපුරයට එල්ල විය. ආක්‍රමණිකයන්ගෙන් බේරී පලායන රජතුමා දුටු ගිරි නම් නිඝණ්ඨ ආගමික පූජකයෙකු රජතුමාට අපහාස සහ සමච්චල් කළ බවත් රජතුමා සතුරන් මැඩ නැවත රාජ්‍ය ලබාගත් පසු ඉහත කී නිඝණ්ඨාරාමය කඩා බිඳ දමා එම ස්ථානයෙහි අභයගිරි විහාරය ඉදිකොට තමා සතුරන්ගෙන් බේරීම සඳහා වනගතව සිටි අවධියේදී උපකාර කරමින් උපදෙස් දෙමින් ජයග්‍රහණය කරා ගෙන ආ කුපික්කල මහාතිස්ස හිමියන්ට පූජා කළ බවත් මහා වංශයේ සඳහන් වේ. ගිරි නිඝණ්ඨ පූජකයාගේ හා රජුගේ නම එකුකොට අභයගිරි යනුවෙන් විහාරය නම් කළ බව අභයගිරියට විරුද්ධ පාර්ශ්වය වූ මහාවිහාරයේ ලියූ මහාවංශයේ සඳහන්ය.

කුලතුංග ටී.ජී., අභයගිරි උරුමය නරඹමු, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ, 2016, පිටුව 2

10. Fa-Hien Travel Records pp. 104, 105 – 107

11. ආගම යනු අධි භෞතික සත්වයන් පිළිබඳ විශ්වාසයයි. E.B. Tylor, 1871, Primitive Culture, John Muray, London

ආගම යනු අධි ස්වභාවික සංසිද්ධියකි. R.R. Marrect, 1909, The Threshold of Religion, London

ආගම යනු පාරිශුද්ධ යැයි සම්මත විශ්වාස හා භාවිතයන් පද්ධතියක් වටා බැඳුණු අන්තර් රඳා පැවැත්මක් ඇති යම් සමාජයක පුද්ගලයන් සියල්ල එක් සදාචාර ප්‍රජාවක් ලෙස සංවිධානය කරන ආයතනයකි. Emile Durkheim, 1915, The Elementary Forms of Religious Life, (Translation by Joseph Swain) George Allen & Ulwin Ltd., London

ආගම යනු පරිසරයත්, මානව ජීවිතයත් මෙහෙයවීම හා පාලනයට ලක් කිරීම කරන මිනිසාට වඩා උත්කෘෂ්ට බලවේග පිළිබද විශ්වාසයන් ය. Sir James Frazer, 1915, The Golden Bough: The study of Magic and Religion, London University Press, London

12. ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ යනු බුදු දහමේ ප්‍රාරම්භකයා වන අතර ලෝකයේ ප්‍රසිද්ධම අධ්‍යාත්මික ගුරුවරයෙක් ද වෙයි. බෞද්ධයන්ට අනුව ගෞතම බුදුරජාණන් වහන්සේ යනු වර්තමානයේ ගෙවී යන මහා භද්‍ර කල්පයේ හතරවන අන්තර් කල්පයේ ලොව පහළ වී වදාළ තුන් ලොවට උතුම් අසහාය ගුරුවරයෙකු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකි. සම්බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයෙක් ද, අමරණීය තත්වයට (නිර්වාණයට) පත් වුවෙක් ද, දෙවියන් ඉක්මවා යන්නෙක් ද, යන කරුණු ථෙරවාද හා මහායාන නිකායන් අනුව තරමක් වෙනස් වේ. ථෙරවාදී බුදු දහමට අනුව උන්වහන්සේ අතිමහත් ඥානයෙන් හා ඉගැන්වීම් හැකියාවක් සහිත වූ අතිශ්‍රේෂ්ඨ වූ මනුෂ්‍ය උත්තමයෙකි. මහායාන බුදුදහමට අනුව සියලු සංසිද්ධි තුළ ඇතුළත් අමරණීය හා දෙවියන් ඉක්මවා යන බුද්ධත්වය නම් සදාතනික සත්‍යයේ ප්‍රතිමූර්තියකි. උන්වහන්සේගේ උපත සිදුවූයේ ඉන්දියාවේ ලුම්බිණියේදීය. ගිහිකල නාමය සිද්ධාර්ථ නම් විය. සාක්‍යමුණි ලෙසද ගෞතම බුදුරජාණන්වහන්සේ හඳුන්වයි.

https://en.wikipedia.org/wiki/Gautama_Buddha

13. ඩේවිඩ් එමිල් ඩර්කයිම් (David Emile Durkheim, 1858-1917) ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයෙකි. ආගම පිළිබඳ විග්‍රහයේදී ඔහු විසින් ලියා ඇති "ආගමික ජීවිතයේ මූලික අවස්ථාව, (The Elementary forms of Religious Life) ග්‍රන්ථය වැදගත් වේ.

14. නිශ්ශංක විජයරත්න 1958 සිට 1962 දක්වා සේවය කළේ අනුරාධපුරය දිසාපතිවරයා ලෙසය. ඒ අනුව අනුරාධපුරය නව නගරය ඉදිවෙමින් තිබූ කලබලකාරී අවධියයි. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා වූ විජයරත්න මහතා පූජා නගරය ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කළේය. පූජා නගරය තුළ ඉදිකර තිබූ අන්‍යාගමික ගොඩනැගිලි සාකච්ඡා මාර්ගයෙන් ඉවතට ගෙන ගොස් ඉදි කිරීමට පියවර ගත්තේය. නටබුන් සහිත පූජා භූමියේ පදිංචිකරුවන් නව නගරයේ පදිංචි කරවා පූජා භූමිය තුළ නිදහසේ වන්දනා කිරීමට අවශ්‍ය පරිසරය සකස් කළේය. එනිසා අදටත් අනුරාධපුරය අටමස්ථානය වන්දනා කරන්නට යන බැතිමතුන්ට අවහිරයකින් තොරව වතාවත් කිරීමට අවකාශ ලැබී ඇත්තේ ඒ හේතුවෙනි.

15. https://sarisaraweb.wordpress.com/2017/03/02/අනුරාධපුරය-අභයගිරිය/

16. අසූවසක් ආයු වළඳා පිරිනිවන් පෑ බුදුරජාණන්වහන්සේගේ දේහය ආදාහනය කිරීමෙන් පසුව උන්වහන්සේගේ ශරීර ධාතූන්ගෙන් සප්ත මහා ධාතූන් ලෙස සැලකෙන කොටස් හතක් හැර ඉතිරි අස්ථි සියල්ල මුං පියලි, කඩ සහල්, අබ ඇට යන විවිධ ප්‍රමාණයන්ට කැඩී බිඳී වෙන්වී ගියේය. ලලාට ධාතු, අකු ධාතු දෙනම, සතර දළදාව යන මේ කොටස් නොකැඩී, නොබිඳුණු සප්ත ධාතූවෝ වෙති. මෙහි එන සතර දළදාව ලෙස හඳුන්වන්නේ රදනක ලෙසින් සැලකෙන දත් විශේෂයයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ශේෂ වූ එම සතර දළදාවන් වැඩ සිටින ස්ථාන බුද්ධවංශ පාළියේ ධාතු භාජනීය කථාවේ එක් ගාථාවක දක්වා ඇත. විමලවංශ හිමි, බද්දේගම (සංස්.), ධර්මප්‍රදීපිකා, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1967

17. මහාවංශය, දළදා පූජාවලිය, දාඨා වංශය, ධර්මප්‍රදීපිකා, දළදා සිරිත, ධාතු වංශය, ෆාහියන් වාර්තා වැනි

18. දළදා සිරිත හා දළදා පූජාවලිය ආදි මූලාශ්‍රවල සඳහන් වන ආකාරයට ශ්‍රී දළදා වහන්සේ විෂයෙහි ඉමහත් පුදසත්කාර නිතිපතා පැවැත් වූ කිත්සිරිමේඝ රජු තම මාළිගාව අසලම නව දළදා මැඳුරක් ඉදිකරවා දළදා වහන්සේ එයට වැඩමවා ඇත. එපමණක් නොව තමන්ට පසුව රජවන සියලුම රජවරුන් ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් වන සියලුම වත් පිළිවෙත් පුදපූජා පෙරහැර ආදිය නොඅඩුව පැවැත්විය යුතු බවත් එය ඉරහඳ පවත්නා තෙක්ම රාජ නියෝගයත් මෙන්ම උත්තරීතර සම්මුතියක් ලෙස ප්‍රකාශයට පත්කළ රජු එය ශිලා ලිපියක් මගින් තහවුරු කොට ඇත. වජිර හිමි, කඹුරුගමුවේ, දළදා ඉතිහාසය සහ සංස්කෘතිය, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2008

19. දේව වන්දනය හඳුනා ගැනීමේදී "දේව" යන නම මුලින්ම යොදා ඇත්තේ ආර්යයන් විසින් බව හඳුනා ගත හැකියි. දේව යන්න "දිව්" දීප්තිමත් යන අරුත ඇති ධාතුවකින් නිපන් පදයක් වේ. "දීප්තිමත් කොටසක්" යන අදහසින් මේ වචනය සැදෙන්නට ඇතැයි සැලකේ. ග්‍රීකයන්ගේ මෙන්ම ආර්යයන්ගේ ද ආදීම දෙවිවරුන් ආකාශචාරීව බබළන කොටසකි. භාරතීය ආර්යයන් මුලින්ම හඳුනාගත් දෙවිවරු රාශියකි. ඔවුන් වැඩි දෙනෙකු ලොව පවත්නා ස්වභාවික වස්තූන්වලට ආරූඪ වූවන් බව පෙන්වා දෙයි. වජිර බුද්ධි හිමි, මඩලගම, දේව පුරාණය සමන් දෙවිඳු හා සමන් දෙවොල ල ශ්‍රී දේවි ප්‍රින්ටර්ස් ලිමිටඩ්, දෙහිවල, 2007, පිටුව, 10

20. ඡායාරූපය-2, අභයගිරි විහාරය ප්‍රතිසංස්කරණයට පෙර ඉදිරිපස දෙරටුව දෙපස පිහිටුවා තිබෙන සංඛ පද්ම දේවාල, පිටුව. 20

https://www.dreamstime.com/royalty-free-stock-photo-abhayagiriya-dagoba-anuradhapura-sri-lanka- image11291295

21. http://archives.sundayobserver.lk/2012/09/09/imp04.asp

22. ඡායා රූපය-, සංඛ පද්ම බහිරව දෙවිවරු උදෙසා තබන පුද පූජා බඩු ලැයිස්තුව, පිටුව 21

## මූලාශ්‍රය


කරුණාරත්න ඩී. (පරි.) (1972). *එදා හෙළදිව*, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

දසනායක, ඩී. එම්. එස්. (2004). *එමිල් ඩර්කයිම්ගේ සමාජ විද්‍යාත්මක චින්තනය පිළිබඳ හැඳින්වීමක්*, සමාජ විමසුම, අංක 11 කලාපය, පේරාදෙණිය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව.

ධම්මානන්ද හිමි, වලානේ, (1916). *පූජාවලිය*, කොළඹ: ජිනාලංකාර මුද්‍රණාලය.

රැල්ප්, පීරිස් (1964). *සිංහල සමාජ සංවිධානය*, කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.

විමලවංශ, හිමි බද්දේගම (1987). *මතිමතාන්තර*, ගම්පහ: දිසානායක මුද්‍රණාලය.

වීරසිංහ, එච්. (1999). *අධ්‍යාපන සංකල්ප පෙරදිග හා අපරදිග*, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

වීරකෝන් ඩබ්. එම් .යූ. (2020). *අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාව*, පේරාදෙණිය, නෙත්වින් ප්‍රින්ටර්ස්.

වජිර හිමි, කඹුරුගමුවේ, (2008). දළදා ඉතිහාසය සහ සංස්කෘතිය, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර ඒ. වී. (2000). *අනුරාධපුර සංස්කෘතිය*, මරදාන: එස් ගොඩගේ සහ සහෝදරයො.

සීලවිමල හිමි, බෝගොඩ (2005). *බෞද්ධ ප්‍රතිමාඝරය තුළට පිවිසි හින්දු දෙවියෝ*, මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී සුමංගල නාහිමි, සහ බටුවන්තුඩාවේ දේව රක්ඛිත හිමි, (සංස්) (1996). *මහාවංශය දෙවන භාග*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී සුමංගල නාහිමි, පහමුණේ, (n.d.), *පොළොන්නරුවේ බුදුරැස් විහිඳ වූ සෝමාවතී චෛත්‍ය රාජයා*, කොළඹ: සමයවර්ධන මුද්‍රණාලය.

Gunasinghe, N. (1990). *Changing, Socio – economic Relation in Kandyan Countryside*, Colombo: Social Scientist Association.

National Peace Council, (2003). *Cost of the War: Challenges and Priorities for the Future*, Colombo: National Peace Council.

Pieris G.H., (2000). *Rehabilitation, Reconstuction and Reconciliation in Retrospect: Pursuit of peace in Sri Lanka. Past Failures and Future Prospects*. De Silva, K.M. and Pieris, G.H. (eds.) Kandy: The International Centre for Ethnic Studies.